නිකොලායි ස්ලද්කොව්

# දේ දුන්නොන් සෙවනා ලබනා වනා පොව්වෝ



කඩුල්ල ප්‍රකාශන



රතුවන්
ස්ටෙප්ස්
භූමිය

කහ-රතු
පාටැති
නටබුන්

කහ පැහැති
වැලි කතර

හරිත
වර්ෂා
නිම්නය



නිල්වන්
විල

තද
නිල්වන්
කඳු

දම් පැහැති
කැනියම

රතුවන්
කඳු ගැට

කඩුල්ල ප්‍රකාශන

නිකොලායි ස්ලද්කොව්

# දේ දුන්නෙන් සෙවන ලබන වන පොව්වෝ

දේ දුන්නේ පාට හතකි
පාට හතම නෙත් පිනවයි.
විනිවිද යන හිරු රැස් වල
දේ දුන්නේ පාට හතම
ගිරි මුදුනේ නිම්න බිමේ
බැවුම්වල වැලි කතරේ
දේ දුන්නෙන් සෙවන ලබති
වන පොව්වෝ කුරුළු පැටවු.



සැකැස්ම
ඊන්නා බොරීසොවා

නව මුද්‍රණය සඳහා සැකැස්ම
තාරක ලියනාඩෝ විපුලගුණ

කඩුල්ල
ප්‍රකාශන

අනුවාදය - දැදිගම වි.රුද්‍රිගු
ජායාරූප - නිකොලායි ස්ලද්කොව්,
ඉස්මයිල් මුහින්, අලෙක්සාන්දර්
ලුහ්තානව්

සිංහල අනුවාදය සහ සැකැස්ම, රාදුගා ප්‍රකාශකයෝ, 1990
ශ්‍රී ලංකාවේ නව මුද්‍රණය - කඩුල්ල ප්‍රකාශන, 2021

ISBN - 978-955-7257-20-4



# පටුන


රතුවන් ස්ටෙප්ස් භූමිය

7

කහ-රතු පාටැති නටබුන්

19

කහ පැහැති වැලි කතර

29

හරිත වර්ණ තිම්නය

41

නිල්වන් විල

53

තද නිල්වන් කඳු

65

දම් පැහැති කැනියම

77

රතුවන් කඳු ගැට

89



හිටි හැටියේම ඈත පෙදෙස රතු පැහැ ගත්තේ ය!
ඊයේ මෙම භූමිය දුර්වර්න කොළ පැහැයක් ගෙන තිබිණි.
අද ඈත පිහිටි නිල්වන් කදු පාමුල තේරුම් ගත නොහැකි ලෙස
සහ බලාපොරොත්තු නොවූ රතුවන් වයිරම් වැටිණි.

# රතුවන් ස්ටෙප්ස් භූමිය

හිටි හැටියේම ඈත පෙදෙස රතු පැහැ ගත්තේය! ඊයේ මෙම භූමිය දුර්වර්න කොළ පැහැයක් ගෙන තිබිණි. අද ඈත පිහිටි නිල්වන් කඳු පාමුල තේරුම් ගත නොහැකි ලෙස සහ බලාපොරොත්තු නො වූ රතුවන් වයිරම් වැටිණි. කිසිවෙක් රතු පැන්සලකින් නිල් පැහැති කඳු හරිත වර්න නිම්නයෙන් වෙන් කරමින් ඉරක් ඇඳි විටෙක මෙනි.

නැත, එය බැස යන හිරුගේ රැස් නොවේ. විසිර තිබෙන රතු ගල් කැටවල දිස්නය ද නො වේ. ස්ටෙප්ස් භූමියේ ඈත ඇති වූ ගින්නක් ද නො වේ.

අපි ඒ දෙසට අසුන් මෙහෙයැවිමු. අප එයට ළං වත්ම, ප්‍රහේළිකාවක් බඳු ඒ රතුවන් වයිරම් වඩාත් පුළුල් විය. ඒ රතුවන් පටිය රතු පොපි මල් මිස වෙනත් දෙයක් නොවේ!

පොපි මල්ය, ප්‍රණීත පොපි මල්ය! ඒවා ලක්ෂ ගණනින් පිපී ඇතැ යි කිව හැකි ය. රක්ත වර්ණ මහා සාගරයක් බඳු මේ පොපි මල් වනය මඳ පවනට හසු වී නැටේ. හිරු රැස් නිසා කාන්තිමත් ලෙස දිලේ. එය මහා ගින්නක ගිනි සිලු බඳුය.

මඳ පවනට නැටෙන රතුවන් පොපි මල් මහා සාගරයේ ඇති වන රැළිවල කිරීට බඳුය. ඒවා අප පෙරළා දැමීමට ඉදිරියට එන්නාක් මෙනි!

අපේ පයට පෑගී තිබෙන පොළව ගිනි ගත්තාක් මෙන් දැනෙන්නේ පොපි මල්වලින් පිරුනු මහා සාගරය නිසාය. ස්ටෙප්ස් භූමියේ සුදු පාට හැරියර් කුරුල්ලෝ උන්ගේ සුදුවන් පියාපත් විදහා ගෙන රතුවන් රැළිවලට උඩින් පියාඹති. රතු පාටට හුරු කුරුමිණියෝ පොපි මල්වල පෙති කති. හරිත වර්ණ මී කන කුරුල්ලෝ, පියාඹන මාළුවන් මෙන් පියාසර කරති. අපේ අශ්වයින් ගේ ඇස්වල රතුවන් පොපිමල් සාගරය පිලිබිඹු වෙයි.

සුදු පැහැති වලාකුළු පවා ලා රත් පැහැයට හැරිලා ය. නිල්වන් පවිත්‍ර අහස ලා රත් පැහැති දුමාරයෙකින් වැසිලා ය. පොපිමල් ඉමක් නැති මහා සාගරය වැන්න! මඳ පවනට වැනෙන පොපිමල් වනය උතුරා නටන ලෝ දියට සමානය!









# ගෙල සුදු කුරුල්ලා

ගෙල සුදු කුරුල්ලා හෙවත් අළුවන් ස්ලාවිකා කුරුල්ලා ගේ හොට කොතරම් කුඩාද යත් , එයින් මැස්සකු වැනි කුඩා සතකු පමණක් අල්ලා ගත හැකි ය. ඒ වගේ පුංචි හොටකින් ගෙනයාමට හැකි කෑමවල ප්‍රමානය ඉතා කුඩා ය. නමුත් ඇගේ කුරුළු කැදැල්ලේ පැටවුන් පස් දෙනෙකි. මේ පැටව් පුංචි වුනාට උන්ගේ කටවල් ලොකු ය. කුරුළු අම්මා කොතරම් කෑම ගෙනවිත් දුන්නද , පුංචි පැටවු අසතුටිනි. "මට දෙන්න! මට දෙන්න, අම්මේ, මට!" යැයි පැටවු කියති.

කුරුළු අම්මා උදේ සිට හවස් වන තුරු තොර තොංචියක් නැතුව පැටවුනට කෑම සොයයි. උදේ කෑමට තිස් වාරයක් ද, දවල් කෑමට තිස් වාරයක් ද, රෑ කෑමට තිස් වාරයක් ද පැටවුනට කෑම දිය යුතුයි. නමුත් කුරුලු අම්මාට එක වරක්වත් කෑමට වෙලාවක් නැත.

පොඩ්ඩක් ගිමන් හැරලා, පිහාටු සුද්ද කර ගෙන, හෙවනට වෙලා චූට්ටක් නිදා ගන්නට ඉඩ තිබේ නම්! අහස දෙස බලන්නට ඕන, රාජාලියෙක්, නැතිනම් උකුස්සෙක් එනවා ද කියලා. හිවලෙක් ළඟ ඉන්නවා ද? මුගටියෙක් ඉන්නවා ද? පුංචි පැටවු බඩගින්නේ කෑ ගහනවා: “මට! මට!” නැවත කැදැල්ලේ සිට කෑම හොයන්න යන්න ඕන. එහෙම කීප වාරයක්ම කළ යුතුයි. පැටව් පස් දෙනෙකුට එක මැස්සෙකු බැගින් එක වරකට ගෙනල්ලා මොනවා කරන්න ද? කුරුළු අම්මාගේ හොටවත් ලොකුවට තිබුණා නම්! පොඩ්ඩක් කෑම දුන්නාම පැටවුන් ගේ බඩගින්න තවත් වැඩි වෙනවා...



## රෑන වටුවා

රෑන වටුවා ගඟිත්ත අයිනේ පෙරළිලා ගියේ රෝදයක් වගෙ යි. ඊළගට ඇය පසු පසින් පැටවු පෙරළෙනවා. උන් හරියට පුංචි පාද සහිත බොත්තම්වලට සමාන යි. වටු අම්මා ගඟිත්තට උඩින් පියාසර කළා. පැටවු කර කියා ගන්න දෙයක් නැතුව වෙරළ අයිනේ ලතැවෙනවා. රාජාලියා මේ පැටවුන්ව දුටුවොත් මොනවා වේ ද?



"මගේ පැටවුනේ, වතුරට වැටිලා පණ බේරා ගනිල්ලා!" කුරුළු අම්මා කීවා. "කවුදෝ එනවා!"

පැටවු ගං වතුරට වැටිලා පුංචි ගල් කැට වගේ නො සෙල්වී ඉන්නවා.

මම ඔවුනට ළං වුනා. පැටවුන් හෙලවෙන්නෙවත් නැත්ව ඉන්නවා. මට නම් මෙහෙම ඉන්නට පහසුයි. පුංචි එවුන් ජලයට වැටිලා ඉන්නේ කොහොමද! ජලය හීතල ය. උන් ගේ පිහාටු තෙමිලා. ගඟේ තියන රළු ගල් කැට පුංචි එවුන්ගේ බඩට පීඩා කරනවා. එසේ නමුදු පැටවු ඒ පීඩාවට ඔරොත්තු දී ගෙන ඉන්නවා.

අනේ පුංචි එවුන්ව මීට වඩා පරික්ෂනයට හසු කිරීමට මා කල්පනා කරන්නේ නැහැ. පුංචි එවුන් තවම දුර්වල යි. පැටවු විභාගයට මූණ දීලා සමත් වුනා. දක්ස පැටවු! ඔවුන් කිසි ම රාජාලියෙකුට පෙනෙන්නේ නැහැ.

මා නැගිට එතැනින් ඉවත් වී ගියේ පුංචි පැටවුන්ට ශීතල නො හැදෙනු පිණිසය.





# බුබුලු කුරුමිණියා

වනයේ පිපෙන විෂ බිම්මල් වගේ බුබුලු කුරුමිණියා ඇසට හසු වෙනවා. කිසිවකුට හෝ බය නැති බව පෙන්වීමට මේ බුබුලු කුරුමිණියෝ මාලයක් වගේ එකට එක් වී ඉන්නවා.

සියලු සත්තු සහ කුරුල්ලෝ මේ කුරුමිණියට බය වෙති. සිවුපා සත්තු උන් ළඟින් යනවා. කුරුල්ලෝ උන්ට කොටන්නට ඉදිරිපත් වන්නේ නැහැ. උරගයෝ අයිනට වෙනවා. ලොකු ගෙම්බන් පවා උන්ව අල්ලා ගන්නට එන්නේ නැහැ.

බුබුලු කුරුමිණියා විෂ බිම්මල්වලට සමාන නිකමට නොවේ. මේ කුරුමිණියා ත් විෂ බිම්මල් වගේ ම විෂ සහිතයි. උන්ගේ පිට පොත්ත බොහොම තද රතු පාටයි. ළං නොවනු. අනතුරුදායක යි! යන දැන්වීම බුබුලු කුරුමිණියා අනිත් සතුන්ට දන්වා හිටිනවා.

උන්ව අතගෑමට කිසිවකු ඉදිරිපත් වන්නේ නැහැ. කිසිවෙක් මේ බුබුලු කුරුමිණියා අල්ලා ගැනීම හෝ ගිල දැමීම හෝ කළොත් , ඔහුට මරණය නියත යි. කුරුල්ලෝ, උරගයෝ, හරක්, අශ්වයෝ, ඒ විතරක් ද ඔටුවෝ පවා උන්ට ළං නොවෙති!.





## ලස්සන කොකා

ස්ටෙප්ස් භූමියෙහි බොහොම අලංකාර කොකෙක් නැටුමක් නටයි. හිස දෙපස සුදු පැහැති සේද පටි වැනි කෙඳි ඇත. සුළඟට ඒවා යම්තමින් සැලෙයි. සමහර විට ඒවා කෙළින් සිටී. ඈත සිට බලන විට ලේන්සුවෙකින් වනන සැටියෙකි.

නමුත් ගෑනු සතා පිරිමි සතාගේ මෙම නැටුම නොදකී. ඈ බෙල්ල නවා ගෙන බිම ඇති කෑම අහුලා ගෙන කමින් සන්සුන් ලෙස ඇවිදියි.

පිරිමි සතා බොහෝ වේගයෙන් නටයි! ආවේශ වී කලබලයට පත් වෙයි. පිරිමි සතාගේ පිහාටු තහඩුවලින් සෑදුවාක් මෙන්, ඒවායින් හඬක් පිට වෙයි. ඌ පියාපත් විදහා ගෙන පුම්බා ගන්නේ කළුකුමකු සේ ය. දුවමින් සිට හිටි හැටියේ නැවතී, ගල් ගැසෙයි. ඊළඟට ඌ පොළවේ වැටී දඟලන්නේ බැලේ නැටුමෙක මිය යන හංසයෙකු මෙනි.

නැවත නටමින් වටයක් යයි. යළිත් පියාපත් විදහා ගෙන කළුකුමකු සේ පුම්බා ගනී. සුළං පාරට උගේ හිස දෙපස රිදීවන් කෙඳි යළි නැටේ.

එහෙත් ගෑනු සතා ගේ නැටුම ගණන් ගන්නේ නැහැ.





## රාජාලියා

සැබෑ ස්ටෙප්ස් භූමියෙහි ගොඩනැගිලිවල රාජාලියන් සිටිය යුතු ය. ස්ටෙප්ස් ගොඩැලි-රාජාලියා නැතිනම්, එය ස්ටෙප්ස් භූමියට සමාන නොවේ. උණුසුම් සහිත ඈත දුමාරයෙකි. කුඩා ගොඩැලි මත සුදුවන් "කෝවිල්" පැළැටිය. ඈත පොපි මල් වලින් ගහන සාගර බඳු පෙදෙස් ය. හැමතැනම නොසැලෙන රාජාලියන් ය. උණුසුම් සහිත පහළ අහසේ කවාකාර ලෙස පියාඹන රාජාලියෝ සිසිල් අහස දක්වා ඉහළට පියාඹති.

පහළ සිටින ලස්සන කොකුන් දෙදෙනා රාජලියාගේ ගොදුරු නොවන බව ඌ දනී. ඍන වටුවෝ ගගිත්ත අසලට දුවැ ගොස් සැඟවී සිටිති. ගගිත්තේ ගල් කැට මොනවාද, වටු පැටවුන් කවුද යන්න වෙන්කර හඳුනා හඳුනා ගැනීමට තරම් රාජලියාගේ පෙනුම පවා තියුණු නැත. සමනලයෝ පොපි මල්වලට ඉහළින් පියාඹති. මේ වගේ කුඩා ගොදුරු වලට පියාපත් වැනීම පවා පාඩු ය. බුබුලු කුරුමිණියෝ රතු පාටින් දිලිසෙති. විෂ නිසා උන්ව කෑමට ගත නො හැකි ය. මාකඳුර අසල කිසිවෙකු හෙළවෙයි. ඒ කවුද? ගෝපරයෙක්! ඌ තණ බිමෙහි පනියි. ගුහාවේ සිට පුළුවන් තරම් ඈත ගිහිල්ලා සැපට වැඩුණු තණ කොළ කාපුවා වේ. එහෙම කාලා සතුටු වුනාවේ. අන්න එවිට රාජාලියා පියාපත් හකුළුවා ගෙනැ ගලක් සේ බිමට පාත් වී දෙපාවල නිය දිගුකර කර ගනී. සමහරවිට රාජාලියාට ගෝපර සුස්ලිකයකු ආහාරයට ගැනීමට හැකි වේවි...



# රැවල් සමනලයා

සමනලයා ගේ පියාපත් රැවල් වලට සමාන ය. මේ කුඩා රැවල් සහිත සමනලයා ස්ටෙප්ස්වල උණුසුම් වාතයෙහි කොතරම් කඩිසර ලෙස පියාඹන්නේ ද යත්, එය දකින අයගේ ඇසට රසඳුනකි. හිතට සතුටකි.

රැවල් සමනලයා මල කට පාත් වන විට, ඌ දෙස බැලීම සතුට ගෙන දෙයි. පියාපත් එක් කැර ගෙන සිටින විට ලස්සන ය. පියාපත් විදහා ගත් විට වඩාත් ලස්සන ය.

ගිම්හාන කාලයේදී සමනල්යෝ ස්ටෙප්ස් භූමියේ අගල්වල සහ මා කඳුරුවල දැකිය හැකි යි. මේ සමනලයෝ ඉතාමත් ලස්සනය. කොතැනදී වුව කොපමණ සමනලයින් හමු වූව ද, උන්ගේ ලස්සන අඩු නොවේ. මිනිසුන් සමනලයින් අල්ලා උන්ව මරා අල්පෙනෙති වලින් උගේ සිරුර සවි කිරීම කොතරම් නරක ක්‍රියාවක් ද!



# කළු ලාක් කුරුල්ලා

ලාක් කුරුල්ලෝ ස්ටෙප්ස් බොහෝ වෙති. ස්ටෙප්ස් ලාක්, කුඹුරු ලාක්, අං ඇති ලාක්, කුඩුම්බි ලාක් සහ කාන්තාර ලාක් ආදී වර්ගවලට අයත් පක්ෂීහු සිටිති. මේ කුරුල්ලෝ කැපී නො පෙනෙති. සරලයහ. උන්ගේ පාට වියළි පසේ පාටට සමානය. හැම දෙනා ගේම ඇසට හසු වන්නේ කළු ලාක් කුරුල්ලා ය. උගේ පිහාටු කලු විලූද මෙනි.

කළු ලාක් කුරුල්ලා බිම දී මෙන්ම වියලි පඳුරුවල සිටින විට දී යසට පෙනේ. එහෙත් වඩාත් හොඳට පෙනෙන්නේ ඌ ඉගිලෙන විටයි. ස්ටෙප්ස් බිමට ඉහළින් කළු ලාක් පියාසර කරන්නේ කවාකාර ලෙසිනි. පියාපත් පුදුමාකාරයකට වනන මේ කුරුල්ලා සෙමෙන් පියාඹයි. කළු ලාක් සිංදු කාරයෙකි. අනිත් ලාක් කුරුල්ලන් මෙන් ම, කළු ලාක් ගීත ගයා ස්ටෙප්ස් බිමෙහි නිහඬතාවය බිඳලයි. දැන් ස්ටෙප්හි සියලු ලාක් පක්ෂීහු ගීත ගයති. උන්ගේ සින්දු එකින් එකාට මාරුවෙයි.

පුංචි ලාක් ගීතයක් ගයයි. ඊළඟට අළු ලාක් ගයයි. තෙවනුව, එම ගීතයට තාලය අල්ලන්නේ කුඹුරු ලාක් කුරුල්ලා ය. අවසානයේ දී කළු ලාක් ගයයි. කළු ලාක් අනිත් සියලු අසයි අසල්වැසි ලාක් පක්ෂීන් වෙනුවෙන් සහ තමා වෙනුවෙන් ද ගයන සැටියෙකි.





## ගෝපරයා

ගෝපරයා ලැග ඉන්නා ගුහාවේ තෙතමනය වැඩි ය. එයා හිරුරැස් ලබා ලබා ගැනීමට එළිමහනට ආවා. ඇවිල්ලා සර්කස් ක්‍රීඩාවල බලු පැටවකු වගේ පස්සා ගාත් වලින් හිටගෙනැ ඉස්සරහ ගාත් දෙක පුංචි බඩ ගෙඩිය උඩ තියාගත්තා. ෂා! හරිම අපූරුයි! කියලා ගෝපර පැංචා හිරු රැස් වලට ඉස්සෙල්ලා එක පැත්තකුයි, පසුව තවත් පැත්තකුයි ඇල්លුවා.

මූණ අතුල්ලා ඇඟපත සුද්ද කර ගන්නට පටන් ගත්තා.කිහිල්ලක් කැසුවා. ඉස්සරහ එක ගාතයක් උස්සලා අනිත් ගාතෙන් කිහිල්ල කසනවා. බඩ වසා ඇති ලෝම  ඉස්සරහ ගාතේ නියපොතු පනාවක් වගේ පාවිච්චි කරලා පීරනවා. දිග ඇදිලා ඇනුම් ඇරියා. උඩු රැවුල පීරා ගත්තා. ඇස් දෙක පිසදා ගත්තා. වටපිට බැලුවා.

ගෝපරයා අවට වෙනත් කිසිදු සතෙක් නැත. දැන් ඉතින් යමක් කෑමට වෙලාව හරි. තණකොල සලාදයක් කාලා, ඊළඟට මල් ටිකක් කෑවා. කන ගමන් හොඳට වටපිට බලනවා. අහළ පහළ කපටි හිවලා ඉන්නවා ද, රාජාලියා පියඹා ඒවිද! එහෙම ආවොත් ගෝපරයා උන්ගේ ගොදුර බවට පත් වෙනවා.



පිරමීඩවල ද, කුළුණුවල ද
මාලිගා වල ද, බලකොටු ප්‍රාකාරවල ද
නටබුන් බැස යන හිරු රැස් විසින්
පෙන්වයි, පැහැදිලි ලෙසින්.

"එය විය නොහැකි දෙයකි!" කහ-රතු පැහැති නටබුන් දුටු මම මටම කියා ගතිමි. එය කොහෙත්ම විය නො නොහැකි දෙයකි!"

එහි හැම දෙයක්ම තිබිණි. පිරමිඩ් වලද, කුළුණු වල ද, මාලළිගාවල ද, බලකොටු ප්‍රාකාර වලද නටබුන් බැස යන හිරු රැස් වලින් පෙන්වයි. පැහැදිලි ලෙසින්. මේ නටබුන් අපූරු රූපාකාරයන් මවාපායි. ඇසට රසඳුනකි.

කහ-රතු පැහැය ඇති වුයේ අළුවන් දුර්වර්ණ කාන්තාරය මත ය. එය අතිශයින් ම චමත්කාරජනක, සුන්දරය. නැගෙනහිර කතාවලට සුදුසු මනහර පසුබිමෙකි. එහෙත් ඇත්ත වශයෙන්ම මේ පුදුමාකාර හැඩයන් ඇති වන්නේ විවිධ පාට වලට අයත්, සුළං සහ වැසි නිසා සෝදා පාලු වූ මැටි වලට හිරුරැස් වැටීම නිසාය. කලාකරුවන් අතුරෙන් මහා කලා කලාකරුවා වන සොබාදහම විසින් මවනු ලැබූ අපූරු නිර්මාණයන් ය, මේවා. මෙය මිරිඟුවක් නොව, එය සැබෑ දෙයකි.

මේ ගොඩැලි හිරු රැස් නිසා රත් වෙලා ය. එමෙන්ම ඒවා රළුය ය. එහෙත් දූලි විලූද මෙන් සිනිඳුය.

# කහ-රතු පාටැති නටබුන්

හැම දෙයක්ම දැකීමට හා මතක තබා ගැනීමට මම යුහුසුළු වීමි. එහෙත් ජවනිකාව නිතර වෙනස් වන විට මා ඒවා මතක තබා ගන්නේ කොහොමද? ඊට පියවර දෙකකට එහා සම්පූර්ණයෙන්ම වෙනස් චිත්‍රයකි. මෙහි කුළුණු මුළු සහ ගොඩැලි වෙනස්ය. හිරු බැස යත් ම, මේ විවිධ හැඩයන් වෙනස් වී, කළු පාටින් ඒවා පෙනිණි. එමෙන්ම විවිධ පාටින් පෙනුණු දේ ද වෙනස් විය. තැනෙක වැඩියෙන් දම්පාටය. තවත් තැනක කහ-රතු පැහැයෙකි. තෙවන තැනක දිලිසෙන කහවන් පැහැය ඇත. මෙය ශ්‍රේෂ්ඨතම කලාකරු වන හිරුගේ නිර්මාණ වේ.

දිවා කාලය එළැඹෙත්ම කඳු වටා එතී තිබුණු මීදුම් පටලය තුනී වී අතුරුදහන් විය.දහවල් දොළහ වන විට, හිරු සුදු පැහැයෙන් බබලයි. අහස ද සුදු පැහැයක් ගනී. කඳු වටා කහවන් දුමාරයකි. හවස හිරු බැස යත් ම, සියලු නටබුන් දම් පැහැයෙන් සහ කහ-රතු පැහැයෙන් බබලයි.

රන් පාටට හුරු මැටියෙන් මෙම චමත්කාරජනක සොබා සිරිය මවා පෑම සඳහා අවුරුදු දහස් ගණනක් ගෙවිණි. සොබා දහමේ විශ්ව කර්මයා විසින් මේ මැටි අනා, පොඩි කොටා, අඹරා, කපා කොටා ගත්තේය. ඒ අපූරු සොබා සිරිය ඔබ ඉදිරියේ ය. අවුරුදු දහස් ගණනක් තිස්සේ වුවද සොබාදමේ විශ්ව කර්මයා ගේ දස්කම් දෙස බැලිය හැකි ය.







# හූපෝ කුරුල්ලා

හූපෝ කුරුල්ලා පියාඹන විට සමොනොලයකුට සමානයි. බිම ඉන්නා විට එයා හරියට ලස් ලස්සන මලකට සමානයි. එයාට බොහොම ලස්සන කරමලයක් වැනි පිහාටු ඔටුන්නක් තියෙන නිසා එයාට කැලෑ කුකුළා කියලා රුසියානුවෝ කියති. ඒ වගේම හූපෝ ගේ දිගැටි හීන් හොටත් යසට කැපී පෙනෙයි.

ඉතින් එයා හැම තැන ම එයා ගේ දිගැති හොට ඔබනවා. සිහින් දිගැති සිදුරුවලට. මෙහි පස් තදය. ගල් කැට වඩාත් ශක්තිමත් ය. මේ නිසා එයාගේ සිහින් දිගැති හොටයට ලෙහෙසි නැත. පණුවන්, මකුළුවන් සහ වෙනත් කෑම වර්ග මේ සිදුරු වල සැඟවී ඉන්නා විට මොනවා කරන්නද?

පොළවේ දිගැති, සිහියන් සිදුරක පතුලේ මකුළු දැලක් දිලිසෙයි. හොට දමලා අදිමුද? හූපෝ හොට දමලා කෝකටත් කියල වැයම් කලා. මකුළුවා සිදුරෙන් එලියට පැනගත්තා. එයාට පෙනුණේ තණ පෙත්තෙකු මකුළු දැලේ පැටලී සිටියා වගෙ යි. හූපෝ කුරුල්ලා එකවර මකුළුවාව ගිල දැම්මා. කිසිම කරදරයක් නැහැ.

ඉගෙන ගත්තා! සිදුර පතුලේ මකුළුවා හිටි හැටි දුටුවොත් කරදරයක් නැතුව ඌව ඇදගෙන කනවා. හොටට ලෙහෙසියක් දැනෙනවා.



# මී කන කුරුල්ලා

මේ කුරුල්ලාගේ පිට රත් පැහැතිය, බොටුව කොළ-නිල් පැහැති ය. බොහොම ලස්සන කුරුල්ලෙකි. නමුත් මේ ලස්සන කුරුල්ලාට විශේෂ නමක් තියනවා. මී මැස්සන් ව අල්ලා කන නිසා එයා ගේ නම මී කන කුරුල්ලා ය. මේ කුරුල්ලා මී වද ළඟට වී ඉන්නවා. මී මැස්සන් ඇති කරන මිනිස්සු මේ කුරුල්ලා දුටු විගස වෙඩි තබති.

මී පැණි වලට ආසා නොකරන්නේ කවුද? මේ කුරුල්ලන්ට ද කැමති මිනිසුන් බොහෝ ය. මේ කුරුල්ලා මී මැස්සන් විතරක් නො වෙයි, නපුරු කුරුමිණියන් ද, පලා ගිරවුන් සහ පතංගයන් ද අල්ලා ගෙන කයි. මී මැස්සා ගේ පරම සතුරා වන බඹරා ද මී කන කුරුල්ලා ගේ ගොදුරකි.

මී මැසි පාලකයිනි, මී පැණි ලෝලයනි! තුවක්කු පැත්තක තබා ශබ්ද විකාශන යන්ත්‍ර අතට ගනිල්ලා! තුවක්කු වෙනුවට ශබ්ද විකාශන යන්ත්‍ර මගින් අනතුරු හඬ නංවා මේ කුරුල්ලන්ව එළවා දමන්න. දිගැති රිටකට රෙදි පටි බැඳ වනන්න. එවිට මී මැස්සන් මෙන් ම මී කන කුරුල්ලන් ද ආරක්ෂා වේ.

මේ කුරුල්ලාට වෙඩි නොතබා එයාගේ ලස්සන බලා සතුටු වන්න. මේ කුරුල්ලන්ගේ මිහිරි හඬ අසා ප්‍රීති වන්න.







## අගාමා කටුස්සා



මූසල උදෑසනක අගාමා කටුස්සා ගේ මනෝභාවය ද මූසලය. එය පුදුමයට කරුණක් නොවේ. ඊයේ තිස්සේ අගාමා හීතලට අසුවෙලා දැන් බඩගින්නේ දුක් විඳිනවා. ඒ නිසා තමයි එයාගේ නහයේ සිට වලිගය දක්වා කොළපාට වෙලා තියෙන්නේ.අගාමා බඩගින්නේ ඉන්න සැටි යසට පෙනෙනවා.

නමුත් ඉර අව්ව වැටෙන විට පස හා ගල් කැට රත් වෙනවා. එවිට අගාමා පඳුරක් යටට රිංගා ගන්නවා. රත් වුනාම අගාමා ගේ සිරුරේ රතු පාටැති පුල්ලි මතු වෙනවා. එය ත් සමග ම එයා ගේ මනෝභාවය යහපත් වෙනවා.

ඉරු මුදුනට නගින දිවාකාලයේදී අගාමා ගේ සිරුරේ සියලු ඇට කටු සහ කොරපොතු හොඳට රත් වෙනවා. මේ වගේ වෙලාවට තණ පෙත්තකු අල්ලා ගත හැකි වූවොත් එවිට සතුට බොහෝම වැඩි වෙයි. එයා ගේ පිට චොකලට් සහ කහ පාටට හැරෙනවා. දෙපැත්තෙන් දම් පාට තීරු මතුවෙනවා. අගාමා පිරිමි සතා නම් එයා ගේ බෙල්ල වටේට නිල් පාට වෙනවා. අව්ව සැර වුණාම එයාට බොහොම ලොකු සතුටක් ඇති වෙනවා!



# ලේන ගෝපරයා

ලේන ගෝපරයා ගේ වලිගය දිගය. එයා ලොකු සණ්ඩුකාරයෙකි. කිසිවකු දුටු විගස එයා යටි උගුරෙන් කෑ ගහන්නා වගේ ශබ්දයක් ඇති කරනවා. ගොඩැල්ලක්, නැතිනම් ගලක් උඩ නැගලා ලේන ගෝපරයා කෑ කෑගහනවා. උඩ පනිනවා. වලිගය වනනවා. එයා කොතරම් කලබල වෙනවා ද යත්, කෑමට කොතරම් ආසාවක් තිබුණ ද, එය පවා අමතක වෙලා කෑ ගසන විට කටේ තිබ්ච්ච තණ කොළ එළියට පනිනවා!



ඒ වගේ සතකු ව හිටිහැටියේ අල්ලා ගැනීමට බැහැ. එයා බොහොම කැමැතියි තිරිඟු ඇට කෑමට. තිරිඟු කරල්වලට ලේන ගෝපරයා ගෙන් උවදුරකි. එයා පුරන් කුඹුරු අසල තිබෙන වතුර ගලා බසින පිහිල්ලට සහ පාර අසල කානුවලට ද, ඒ වගේම මිනිසුන් අහළ පහළ නැති ආගාධ වලටද කැමතියි. ලේනෙකු වගේ පනින මේ ගෝපරයා හාවකු වගේ පස්සා ගාත් වලින් ඉඳ ගනී. මහ පොළොවේ ගාටමින් ගමන් කරන්නේ බැජර් සතා මෙනි. වරෙක කුරුල්ලකු වගේ හඬ නගන ලේන ගෝපරයා තවත් වරෙක පැටවකු සේ කෑ ගසයි.



# හී සර්පයා

හිරු බැස යාමට පටන් ගත් හැන්දෑවෙ හිටි හැටියේ අහළ පහළ ඇති පඳුරක තහඩු කැබැල්ලක් වගේ යමක් දිලිසෙනවා. ඒ තම යි බැස යන හිරු රැස් නාන හී සර්පයා. සමහර විට එයා දිවා කාලයේ දී ලැබුණු හිරු රැස් නිසා පීඩා විඳලා දැන් විවේක ගන්නවා වගේ. නැතිනම් එයා නිවහනය දිහා බලනවා වෙන්නට ඕන.



වටකුරු ඇස් වලින් හී සර්පයා හැම හැමතැනම බලනවා. එයාට හැම දෙයක්ම පෙනෙනවා: කවුද බිම් දිගේ දුවන්නේ, කවුද අහසේ ඉගිලෙන්නේ?

ටොලායි වර්ගයට අයත් හාවෙක් පදුරකට මුවා වෙලා ඉන්නවා. කැලෑ මීයෙක් එයාගෙ ගුලෙන් එළියට ඇවිත් හොම්බයි, රැවුළු ගසු යි එළියට දමා ගෙන ඉන්න සැටි පෙනෙයි.සර්පයින් අල්ලාගෙන කන උකුස්සෙක් එයාව නොදැක පියාඹා ගිය සැටි හොඳ යි. අනූ නවයෙන් බේරුණා. ඔන්න එයාට යස ගොදුරක්-නයා ගේ රස බොජුනකි කටුස්සා!

හී සර්පයා දරුණු ගැහිලා ඊයක් විදින්නා වගේ එක පාරට ම කටුස්සාගෙ ඇඟට කඩා පැන්නා. හී සර්පයා කටුස්සා වටේට එතිලා සෙවණ ඇති තැනකට ඌව ගෙන ගියා. අනුන්ට නො පෙනී හී සර්පයා ගොදුරු ගිල දමාවි.





# පුංචි රාජාලි බස්සෝ

රාජාලි බසු අම්මා සුදු පාට වටකුරු පුංචි බිත්තර දෙකක් දමා ඒවා රකින්නට පටන් ගත්තා. එයා බිත්තර රැක්ක ට බිත්තර වලට මොනවා වෙනවා ද යන්න දන්නේ නැහැ. දවස් පතා බිත්තරවල බර අඩු වෙනවා.

බිත්තරයක් දැමූ හැටියෙ එහි බර ග්‍රෑම් හැත්තෑවයි. දවස් දහයක දී එක බිත්තරයක බර ග්‍රෑම් පහකින් අඩු වෙනවා. දවස් විස්සක දී බිත්තරයක මුල් බරෙන් කාලක්ම අඩු වෙනවා. එහෙම වුනොත්, බිත්තර රකින කාලය අවසන් වනවිට, ඉතුරු වන්නේ බිත්තර කටුව විතරයි.

නමුත් එහෙම වුනේ නැහැ. බිත්තර පුපුරා පැටවුන් එළියට එනවා. උපන් මොහොතේ සිට මේ පැටවුන්ගේ බර පැයකට ග්‍රෑම් දෙක බැගින් වැඩි වෙනවා. මේ පැටවු මහ ගොඩක් කෑම කනවා. දවස් හතරකින් පැටවුන්ගේ බර දෙගුණයකින් වැඩි වෙනවා, දවස් හතකින් බර හතර ගුණයකින් වැඩි වෙලා! කූඩුවෙන් පිටවනවිට පැටියා ගේ බර බසු අම්මා ගේ සහ බසු තාත්තගේ බරට ත් වඩා වැඩි යි. දැන් ඉතින් ඒ ගොල්ල පැටවුන් නොවේ. ඒ උනාට ඒගොල්ලොන්ට තවම ඉගිලෙන්නට බැහැ.



නිදිබර කඳු පාමුල සුළං පහර
දෙකක් එකිනෙකට හැප්පිණි,
මේ වැලි වැලිකන්ද ඇතිකරමින්...

ඉර අව්වේ සැර කොතරම් දැයි කියනවා නම්, එය විශාලන වීදුරුවකින් ඔස්සේ එන්නාක් මෙනි. සදා පිපාසයෙන් පෙළෙන වැලි කතරේ මැස්සෝ ගිජු ලෙස මුහුණට ඇලෙති. ඉමක් නැති ස්ටෙප්ස් භූමිය සහ නිල්වන් අහස ය.

වැලි කතර අයිනේ පැතලි දම්පැහැති කඳු දෙකකි. ඒවා නිදන ඉබ්බන් දෙදෙනකු සිහි ගන්වයි. ඒ දෙක අතර රන්වන් වැල්ලෙන් සෑදූ උසැති පිරමීඩයෙකි.

නිදිබර කඳු පාමුල සුළං පහර දෙකක් එකිනෙකට හැප්පිණි. මේ වැලිකන්ද ඇති කරමින්, ගිනි කන්දක මුදුනක් සේ මේ වැලි කන්දේ මුදුනෙන් දුම් වලා අහසට නගී.

ඉහළ නැගීමේ ඉතාම හොඳ ක්‍රමය මියරාකාර ක්‍රමය යි. පියස්සකට නගින්නාක් මෙන් සෙමින් ඉහල යයි. වැලිකැට පා උඩට වැටෙයි, පයට පෑගී සෑදුණු වළවල් වහා පිරෙයි. උණු සුළං මුහුණට වදින අතර සුළඟට ඉගිලෙන වැලි මුහුණට වැදෙන මෙවන් වෙලාවක දී ඉතා ම අවශ්‍ය දේ නම්, බීමට වතුර ය. එහෙත් ජලය ඇත්තේ ඈත පෙදෙසක ය. උණු සුළඟ මුහුණට වදී, වැලි කැට කට තුළට වැදී දත්වලට හැපී හඬක් ඇති කරයි.

ඔබ කැමති තවත් දෙයක් නම්, කන්දේ කටහඬය. මෙය සාමාන්‍ය කන්දක් නො වේ. ගී ගයන කන්දකි. විටින් විට කන්ද අභ්‍යන්තරයෙහි හඬක් හට ගනී. එවිට කන්ද සෙළවෙයි. මේ හඬ කෙමෙන් වැඩි වී මුළු මහත් කතර දෙවනත් කරමින් හඬ පිටවන්නේ අනතුරක් සහ වටහා ගත නොහැකි ලෙසිනි. එලෙස කන්ද 'ගී ගයයි'.

# කහ පැහැති වැලි කතර



මේ කන්ද ගැන පැතිර ඇති කතා බොහෝය. කන්ද ගී ගයන්නෙ මන් දැයි කිසිවෙකු නො දනී. අනුමාන නිගමන සහ කල්පිතයන් පමණකි, මේ ගැන ඇත්තේ.

කඳු මුදුනට නැග ගතිමු. අද කන්ද නිහඬය. සුළඟ හඬ නගයි, හිරුරැස් ඉතා පීඩාකාරී ය. හිරු රැස් සහ සුළං නිසා ඇස් වලින් කඳුළු ගලයි. කඳුළු බොන මැස්සෝ මුහුණට පහර දෙති.







# දාර පිඹුරා

මේ පිඹුරා ගේ දිග මීටරයකට වැඩි නො වේ. අනිත් ලක්ෂණ අතින් ඌ නියම දාර පිඹුරෙකි. මූ වැලි යටින් බඩගා යාමට දක්ෂ නිසා වැලි පිඹුරා යන නමින් ද හැඳින්වේ. කුඩා වුවද මේ පිඹුරා ඉතා දක්ෂය.

කටුස්සෝ හිරු රැස් නාති. කුරුල්ලො කිචි බිචි ගාමින් උඩ පනිති. කුඩා සත්තු ඇවිදිති. එහෙත් මේ සතුන්ගේ පාද යටින් පිඹුරකු සැඟ වී සිටින බව උහු නො දනිති.

ඌ වැලි යට සැඟ වී ඇස් දෙක පමණක් පිටතට දමා ගෙන වට පිට බලයි.

හාවා තරමක් ඈතින් ඉන්නා බව දාර පිඹුරා සිතයි. සක්සවුල් ගහේ උඩ අත්තක වහලා ඉන්න කුරුල්ලා දෙස පැනීමට බැහැ. එයා උසකට වෙලා ඉන්නවා. ස්ටෙප්ස් බළලා පරීක්ෂාකාරී ලෙස පාද තබයි. මේ බළලාට දිවා කාලයේ මේ කතරේ ගමන් කරලා පුරුදු නැත. එයා ගේ ඇස්වල කළු ඉංගිරියාව තිතක් තරම් කුඩා නිසා සමහර විට එයාට පිඹුරා නොපෙනී යාමට ඉඩ ඇත. මීයන් පමණක් නොව අතට අසුවන මකුළුවන්, ගෝනුස්සන් කටුස්සන් සහ කුඩා සර්පයන් මේ බළලා අල්ලා ගනී.

ආන්න අතන වටකුරු ඔළු ගෙඩියක් ඇති මෝඩ කටුස්සෙක් ඉන්නවා. එයා මා ළඟට වඩ, වඩාත් ළං වෙනවා. හිටි හැටියේ ම වැලි උඩ ගිහිල්ලා දාර පිඹුරා උඩ පැනලා කටුස්සා වටේ එතිලා ඌව ගිල ගැනීමට සූදානම් වෙනවා...



# ජෙර්බෝවා

ජෙර්බෝවා පුදුමාකාර සතෙකි. එයාගේ සිරුර මීයෙකුට සමානයි. දෙකන් හාවෙකු ගේ වගේ ය. කකුල් කැන්ගුරු ගේ පාද වලට සමාන යි. එයාගෙ 'සිංහ' වලිගය අග බූසියක් වගේ ලොම් පොකුරක් තියෙනවා! දිවා කාලයට නිදා ගන්නා ජෙර්බෝවා රාත්‍රී කාලයේදී දුව පැන ඇවිදිනවා. ජෙර්බෝවා දුවන හැටි! සියලු සිවුපාවෝ සතර පාදවලින් දුවති. නමුත් ජෙර්බෝවා පස්සා ගාත්වලින් උඩ පැන, පැන යන්නේ කුරුල්ලන් වගේය!



මේ සතා අනික් සතුන්ට වඩා බොහොම වෙනස්. සිහින් පාද, තරබාරු පාද, නැතිනම් දිගැති පාද සතුන් ට තියෙනවා. ජෙර්බෝවා සතාට තියෙන්නෙ බූව වැනි ලොම් සහිත පාද, බොහෝ සතුන්ට මහත සමක්, නැතිනම් මහත ඔළුවක් තිබුණාට ජෙර්බෝවා ගේ වලිගය විතරයි මහතට තියෙන්නේ. මේ වලිගය ජෙර්බෝවාට බොහොම පිහිට වෙනවා. මේ සතා ඉඳ ගන්නා විට වලිගය රැකුලක් නැතිනම් කරුවක් බවට පත්වෙනවා. උඩ පනින විට එය තුලනයක් බවට පත් වෙනවා. අනතුරට මුහුණ පෑ විට ඒ වලිගය නිසා සතුරාව රවටා දැමීමට ජෙර්බෝවාට හැකි වෙනවා. ජෙර්බෝවා ගේ වලිගයේ අගට තිබෙන සුදු පැහැති බූසිය දැකලා හිවලා එය අල්ලා ගැනීමට පනිනවා. එවිට ජෙර්බෝවා වලිගය වමට හරවා දකුණු පැත්තට පනිනවා. හිවලා වගේ කපටියකු පවා රැවටෙනවා.



# ප්‍රාවරණ වැලි කුකුළා

මුහුදු ලිහිණියන් නැති මුහුද පාලුය. කෝකිලයා නැති වනය ද පාලුය. කඩිසර වැඩි කුකුළාගේ ගුරු-ගුරු ශබ්දය සහිත ගීතය නැති නම්, වැලිකතර සොහොනකට සමාන වේ.

ප්‍රාවරණ වැලි කුකුලෝ සියලු දෙනාම වතුර බීමට ස්ටෙප්ස් භූමියේ ජල උල්පත් වලට පියඹා එති. බොහෝ වේලාවක් තිස්සේ ගිජු ලෙස මේ කුකුළන් වතුර බොන්නේ හොට ජලයට ඔබාගෙන ය. හිතේ හැටියට වතුර බීලා තමන් ගේ පුංචි පැටවුන්ට බීමට වතුර ගෙනෙන්නේ කුරුළු බොක්ක හෙවත් ගොජුරට වතුර පුරවාගෙනය.

ගිනි අව්වට හසුවී තිබෙන වියලි ස්ටෙප්ස් භූමියේ වැලි ගිනි රත් වෙලා ය. මඩ වියළි ගොස් පැලිලාය. ඉර අව්ව නිසා ගල් කැට කළු පැහැ ගෙන ඇත. ප්‍රාවරණ වැලි කුකුළාගේ එකම ගැලවීම වතුර පමණකි. මේ සතුන්ට ඔරොත්තු දීමේ ශක්තිය සහ ඉවසීම තිබේ. මේ කුකුළන්ගේ පාට වැලි පාටට සමාන ය. පියාපත් ඉතා ශක්තිමත්ය.

ඉතා සැර අව්ව නිසා කඳු රැලිවලට සමාන වේ. ඒවා සෙලවෙන සැටියෙකි. වියළී ඉරි තැලී ඇති වැලි කතරේ පටලය විනිවිද යන සේ ප්‍රාවරණ වැලි කුකුළා හඬ නගයි. එම හඬ ගලා බසින ගගිත්තක ජලය නගන හඬට සමානය.



# වැටි හූරා



මේ සාමාන්‍ය වැටි හූරකු නොවේ. ලොකු කන් ඇති වැටි හූරෙකි. ඒ කන් වලට ඉතා හොඳින් ඇසේ.

අඳුරු වැටුණු පසු නිහඬ වෙලාවට සැඟවී සිටින තැනින් එළියට එන වැටි හූරා ඉක්මනින් වැලි පොළවේ දුවයි. එයාගෙ දෙකන් ඉදිරියට නැමිලා ය. නහය සහ දෙනෙත් පොළොව දෙසට යොමු වී ඇත. හිටි හැටියේම පොළවේ පැල්මෙකින් කොළ පැහැති ඇස් දෙකක් දිලිසෙයි. ඒවා දිවි මකුළුවා ගේ ය. ගල් කැටයට එහා ඇසි පිය රහිත රතු වන් ඇස් දෙකකි. එය කාන්තාර හූනෙකු ගේ ය. සක්සවුල් පඳුරකට එහා තවත් නිල්වන් පැහැති ඇස් දෙකකි. මේ ඇස් දිලිසෙන්නේ සඳ එළිය නිසාය.

වැටි හූරා ඒවාට බය නැත. අනතුරක සංඥාව දැනුණු විගස වැටි හූරා බෝලයක් වගේ ගුළි ගැසෙන්නේ කුඩා ඉදිකටු වැනි උල් පිටට සිටින සේ ය. එලෙස එයා මද වේලාවක් ගුළි ගැසී ඉන්නවා. අනතුර පහ වී ගිය පසු එයා යළි දිග ඇදිලා වට පිට බලමින් ඉව අල්ලමින් යනවා. එයාගෙ කන් වලට හැම හඬක් ම ඇසෙනවා. රාත්‍රී කාලය වැටි හූරා අපතේ හරින්නෙ නැහැ. රෑට කෑම හොයාගෙන දවාලට ඉර පෑව්වා ම නිදාගන්නවා.





# වටකුරු හිසැති කටුස්සා

මේ කටුසු වර්ගය වැලි කතරේ ජීවත් වන අතර උන්ගේ සිරුර ද වැලි වලින් ම සෑදී තිබෙන්නේ යැයි සිතිය හැකි තරම් ය. වටකුරු හිසැති කටුස්සා ගේ කොරපොතු වැලි කැට වලට බෙහෙවින් සමානය. එයා වැලි ගොඩේ ඉන්න විට වැලිවලින් වෙන්කර ගැනීමට ඉතා අමාරුය. විශේෂයෙන්ම හතර ගාතෙන් වැලි වලට ඇලිලා සිටින විට උගේ හෙවනැල්ල නැති බැවින්, වඩාත් අමාරු ය. හිටි හැටියේ ම වටකුරු හිසැති කටුසු රාළ වැලි යටට රිංගා ගන්නේ සිරුර සොලවමින්, ගැස්සෙමින්, පාද සහ හිසද වැළි තුළට දමා ගනිමින් ය.

මිනිසා කම්බිලියක් පොරවා ගන්නා සේම, මේ කටුස්සා වැලිවලින් සිරුර වසා ගනී. සුළං හමයි. එවිට වැලි පොළව සමතලා වෙයි. මොහොතකට පෙර සිටි කටුස්සා අතුරුදහන් වෙලා ය. දැසින් දකින දේ පවා විශ්වාස කළ නොහැකි තරම්ය.!



# ෂ්රයික් කුරුල්ලා



ඈත සිට බලන විට ෂ්රයික් කුරුල්ලා පෙනෙන්නේ සුදු ලපයක් මෙනි. ඔබ සැඟවෙන්නේ නැතිව ගිය ද කුරුල්ලා නොසැලී සිටී. ඔබ ඌට ඉතාම ළං වන විට ෂ්රයික් කුරුල්ලා වාඩිවී සිටි අත්තෙන් ඉගිලී, පහලින් පියඹා යමින් පලාවන් අත්තටු වනයි. ඉන්පසු මේ කුරුල්ලා ඉහළට පියඹා ගොස් යළි අතත්තට වසයි.

කටු සහිත පඳුරේ මේ කුරුල්ලා කෑම රැස් කර සිටී. කොතරම් කෑම ගොඩක් ද!

මේ කටු සහිත පඳුරේ කුරුමිනියන්ගේ තණ පෙත්තන් ගේ, බඹරුන්ගේ සහ කුරාවන් ගේ මළ කුණු ය. මේවා වැහි කාලෙට අවශ්‍ය කෑම ය. වැසි සහිත සීත දවස් වලට මේ කුඩා කෘමි සත්තු සැඟවෙති. ෂ්රයික් කුරුල්ලාගේ පැටවු හැම තිස්සේම බඩගින්නෙ කට ඇරගෙන ඉන්න නිසා උන්ට කෑම දිය යුතුය.



## හුබාරා (බුස්ටාඩ්) කුරුල්ලා

මේ ඉන්නේ බුස්ටාඩ් කුරුල්ලෙකු නොවේ. කුරුළු පැටවෙකි. මේ කුරුල්ලා ඉතා ලස්සන යි. ඒ වගේම ඉතා විරල යි. මේ වර්ගය හුබාරා නමින් ද හැඳින්වේ. හුබාරා කුරුල්ලෝ අව්වට ගිනි රත් වූ, වියලි ස්ටෙප්ස් භූමියෙහි බිත්තර දමති. කුරුළු පැටවුන්ට ලෙහෙසි නැත. ඉහළින් ගිනි අව්ව ය. පහළින් අව්වට ගිනි රත් වූ ගල් කැට ය. වටේට ඉතා උණුසුම් සුළං හමයි. පැටවාට සැඟවීමට තැනක් නැත.

පැටවා ළඟ කුරුලු අම්මා හිටියා නම්, හොඳයි. කුරුළු අම්මා අත්තටු වලින් පැටවා ගිනි ගහන අව්වෙන් ආරක්ෂා කරනු ඇත. නමුත් කුරුලු අම්මා සතුරන් ඉදිරියට යාමට බය වන්නේ එයාගේ පැටවුන්ව උකුස්සන්, හිවලුන් නැතිනම් වෘකයින් හඳුනාගෙන ගොදුරු කර ගනු ඇතැ යි සිතන නිසා ය. මේ පැටවුන්ට ස්ටෙප්ස් භූමියේ බළලා සහ උගුඩුවාද සතුරෝ වෙති.

මේ වර්ගයට අයත් කුරුල්ලන් මිනිස්සු නොගැවසෙන ස්ටෙප්ස් භූමිවල පවා ඉතිරි වී ඇත්තේ ඉතා අල්ප සංඛ්‍යාවකි. නීති විරෝධී දඩයක්කරුවෝ මේ කුරුල්ලන් මරා විනාශ කරති. උන්ගේ සීඝ්‍ර පාද, ශක්තිමත් පියාපත් සහ තියුණු ඇස් වලට පවා ජීවිතය ආරක්ෂා කර ගත නො හැකි ය. මේ කුරුළු වර්ගය දැඩි විශ්වාස තබා ඇත්තේ උන් ගේ ආරක්ෂාකාරී පාටට ය. උන් බිම වැතිර නො සැලී සිටින්නේ සතුරා සමහර විට උන් නො දකිති යි යන විශ්වාසයෙනි.





# කාන්තාර හූනා

කානාන්තාර හූනා ගේ සම ලස්සන කමිසයකට සමාන ය. තද පැහැති කොරපොතු බොත්තම් වගේ ය. එයාගේ පස්සා ගාත් වැසී තිබෙන සමද කලිසමක් ලෙස හඳුන්වමු. එය සුදුවන් රැළි සහ වාටිවලින් යුක්තය. මේ වගේ සමකින්, නැතිනම් ඇඳුමකින් පෙනී සිටීමට ලජ්ජා නැත.

මේ සම ගෙවී ගිය පසු හූනාට වෙනත් සමක් ඇති වෙයි.

පිට අයගේ කුතුහලය සහිත ඇස් වලට නො පෙනෙනු වළකට රිංගා, හූනා පරණ සම හෙවත් ඇඳුම ගලවා දමයි. ඒ සඳහා විශාල පරිශ්‍රමයක් දැරිය යුතු ය. පරණ සම ගලවා දැමූ විගස අලුත් සමක් හූනාට ලැබේ! යළිත් බොත්තම් වැනි කොරපොතු දිලිසෙයි. පසුපස ගාත්වල ඇති අලුත් සමෙහි රැළි සහ වාටි දිලිසෙයි.

හූනා විසින් අතහැර දැමූ හම ඒ සතාට අයිතිය. එයා එය ගුළි කොට කටේ දමා ගන්නේ ඉදිරිපස ගාත්වල ආදාරයෙනි! එය අපතේ යාමට ඉඩ නොදිය යුතුය . එයාගේ පරණ සම ගිල දමා එයා තලු මරයි. සම පරණ වුනත් එයින් ප්‍රයෝජනයක් ලැබුණා!



උදෑසන හිරු රැස් තුරු පත්‍ර
විනිවිද යයි. නත්තල් ගස්වල
තිබෙන කුඩා ඉදිකටු හිරු
රැස් වලට දිලිසෙයි. හැම තැන ම
හරිත වර්ණයෙන් බබළයි.
මේවායේ පැහැය විවිධාකාරය.

නිම්න භූමිය කොළ පාටය. පිණිවලින් දිලිසෙයි. විශාල ගල් කැට අතරින් ගංගාවක් ගලා බසී. විසි වී යන කුඩා අයිස් කැබලි දෙස බැලීමෙන් පවා ඇඟ කිලිපොලා යයි. උදෑසන ඉතා දැඩි ශීතලය. එමෙන්ම විනිවිද යන තරම් පවිත්‍ර ය. කඳුකර වාතය රෝග සුවකළ හැකි ඔසුවක් මෙනි. එයින් දත් පවා හිරි වැටෙයි.

උදෑසන හිරු රැස් පත්‍ර විනිවිද යයි. නත්තල් ගස්වල තිබෙන කුඩා ඉදිකටු හිරු රැස්වලට දිලිසෙයි. හැමතැනම හරිත වර්ණයෙන් බබලයි. මේවායේ පැහැය විවිධාකාර ය. ඉතා තද කොළ පැහැයේ සිට මෘදු ලා දළු කොළ පැහැය දක්වා දක්නට තිබේ. ලපුහ් කොළ බූරුවන්ගේ කන්වලට සමාන ය. ඒවා සුළඟට යම්තමින් සෙළවෙයි. තණ පඳුරු උසට වැවිලා ය. ඒවා පිණි වලින් නැවිලාය. නිල් පැහැති සහ කහ පැහැති මල් හරිත වර්ණ පසුබිම් කර ඇත. හැම තැන ම තුරු ලතා ය. පඳුරු ය!

ෂිපොව්නික් පදුරු මල් පාත්ති වලට සමාන ය. මේවා සුදු, කහ, රෝස පාටින් යුක්ත ය. බාබෙරි පඳුරුවල කහවන් මල් ය. මීමැස්සෝ, සමනලයෝ සහ බඹරු මල්වලින් පැණි උරති.

තොපොල් හෙවත් පොප්ලර් ගස්වල මුදුනේ කොළ පොකුරට වැවිලා ය. නත්තල් ගස්වල රතුපාට ගෙඩි වැවී ඇත. අළු පැහැති ගල් කැට එක්තරා සිත්තමක් මවා පාන්නක් මෙනි. උසැති නත්තල් ගසෙන් වැටෙන සෙවන අනුව මේ හරිත වර්ණ වනයේ කාල මැනිය හැකිය.

# හරිත වර්ණ නිම්නය









## ජීවං ජීවී පැටවා

බිත්තර දොළහකින් ජීවං ජීවි පැටවුන් දොළොස් දෙනෙක් උපන්නා. මේ පැටවුන් ඩැන්ඩිලායන් මල් වගේ පුළුල් වලට සමාන යි. වෙනසකට ඇත්තේ මේ ඩැන්ඩිලායන් මල් වැනි පැටවුනට හොටක් සහ කකුල් දෙකක් බැගින් තිබීම ය. ඉක්මනට පැටවුන් උන් ගේ හොටින් යමක් කොටමින් පුංචි පාදවලින් ඉක්මනට දුවන්නට පටන් ගත්තා. එහෙම දිවීම නිසා අමාරුවේ වැටුනා. එක් පැටවකු පඳුරකට රිංගා නැති වුණා. තවත් පැටවකු කැලෑ බළලා ඩැහැ ගෙන ගියා. ජීවං ජීවි අම්මා මේ පැටවුන් ආරක්ෂා කිරීමට හැම දෙයක් ම කළා. වරෙක සතුරාට විරුද්ධව සටන් කිරීමට වේගයෙන් ඉදිරියට පනින ජීවං ජීවී අම්මා තවත් වරෙක බොරුවට තුවාල වූ බවක් අඟවා සතුරාව වෙනත් පැත්තකට ගෙන ගියා. නමුත් ඊට දවසකට පසුව එක් පැටවකු ව හිවලා ගෙන ගියා. අනෙක් පැටවා උකුස්සා ඩැහැ ගත්තා.

ඉතුරු වුණ පැටවු සැඟවීමට ඉගෙන ගත්තා. අනතුරක ඉව දැනුණු විගස එක් පැටියෙක් ගොඩැල්ල ට මුවා වුනා. තවත් පැටියෙක් පඳුරකට රිංගලා සැඟවුනා. තෙවන පැටවා මැරිලා වගේ බිම වැටිලා හිටියා. කිසිම සතෙකුට බැහැ එහි ජීවං ජීවී පැටවුන් ඉන්නවාද කියලා දැනගැනීමට.



## වෙරල වටුවා



බැලූ බැල්මට එයා වෙරළ වටුවෙක් වගේ සාමාන්‍ය කුරුල්ලෙකි. කඩිසර, ජංගමශීලී, දක්ෂ කුරුල්ලෙකි. මේ වෙරල වටුවා. නමුත් හොඳින් ලංවෙලා එයාව පිරික්සා බැලුවොත් සුදු පාට වෙරළ වටුවා ට වඩා මේ වර්ගය වෙනස් බව පෙනෙයි. එයාගෙ ඔලුව කලු කළු පාට යි. නමුත් බෙල්ල ද, ඇස් ළඟ පෙදෙස හා නළල ද සුදු පාටයි. මේ නිසා මේ කුරුල්ලා 'වෙස් මූණු' වෙරළ වටුවා නමින් හැඳින්වේ. අනිත් ලක්ෂණ අනුව මේ කුරුල්ලා ද සුදු වෙරල වටුවා මෙන් ම වේගවත්ය. ජෛවම ය. උනන්දුවකින් යුක්ත ය. එයා ගේ ගායනය ද සුදු වෙරළ වටුවා ගේ ගායනයට සමාන ය. පියෑඹීමෙහි දක්ෂ ය. දිවීමෙහි කඩිසර ය. ලොකු ගල් ගැටයක් හෝ ලී කොටයක් හෝ උඩ වහලා එයාගෙ දිගැති වලිගය වැනීමට එයා බොහොම කැමතියි.

වසන්ත කාලයේදී වෙරළ වටුවා නටන්නෙ වලිගය උඩට ද, පිහාටු බිමට ද හරවාගෙන ය. හොට ඉදිරියට දමාගෙන ය. වටේට යමින් වෙරළ ඔටුවා හිස පාත් කොට නමස්කාර කරයි.

වසන්තයේ මුල් කාලයේදී සිට සිසර සමයේ අවසාන කාලය දක්වා මේ කුරුල්ලා ගංගා සහ පොකුණු අසල වාසය කරයි. වෙරල වටුවා දෙස බැලීම පවා ප්‍රීතියකි!.





# මුව දෙන

හිරු උදා වන විට සහ බැස යන විට මුවා කැළෑවේ එළිමහන් තැනට පැමිණෙයි. එහෙත් මෙහි දී පවා මුවා දෙස බැලීම ලෙහෙසි නො වේ. මුවා නිතර බියෙන් සිටින පරිස්සම් කාරී සතෙකි. නිතර නිතර එයා හිස හරවා බලයි. කන් යොමා සවන් දෙයි. නහයෙන් ඉව අල්ලා බලයි. මුවා ගේ ඇස් පෙනීම හොඳ ය. කන් ඇසීම වඩා ත් හොඳය. ඉව ඇල්ලීම ඊට ත් වඩා හොඳය. ඒ නිසා මුවා එයා ගේ ඇස්වලට සහ කන්වලට වඩා වැඩි විශ්වාසයක් ඉව ඇල්ලීමේ නාසය කෙරෙහි තබා ඇත. ගමන් කරන විටද, බිම වැතිර සිටින විට ද, තණ කන විට ද මුවා වැඩි විශ්වාසය තබන්නේ නාසය කෙරෙහි ය.

ඉතා සුපරික්ෂාකාරී ය. එමෙන්ම කුතුහලය සහිත ය. අනතුරක් දැනුණු විගස 'පණ එපා' කියල දුවන්නේ නැත. ළඟ ඇති පඳුරකට, නැතිනම් ආරක්ෂක තැනකට වෙලා සතුරා ලුහුබැඳ එනවාද, නැද් ද කියා සොයා බලනවා. තවත් දුර දුවන්නට ඕනෑ ද නැද් ද?

මිනිහෙකුගේ ඉව වැටුණු මුව දෙන පරිස්සම්කාරී වෙලා පැන දුවන්නට සැරසෙනවා. මුව දෙන පමා වුන නිසා එයාව ඡායාරූප ගත කිරීමට පුළුවන් වුණා. දැන් ඉතින් මුව දෙන පැනලා ගියාවේ. අපට එයා ගේ ඡායාරූපයක් තියෙනවා. මේ චිත්‍රයෙන් පෙනෙන්නේ සයිබීරියානු ස්ටැග් වර්ගයට අයත් මුව දෙනකි.



## කුරු බස්සා



අප දන්නා බස්සන් අතරින් ඉතාම කුඩා බස්සා කුරු බස්සා ය. කුරු බස්සා පුංචි  පමණක් නොව පාටින් ද ඇඳිරිය. ගහක අත්තක වසා සිටින විට මේ කුරු පැංචාව කොහෙත් ම පාහේ  නො පෙනේ. මේ කුරු බස්සා ඇස් දෙක වසාගෙන දිග ඇදුනු විට, එයා ගසේ වියලි අත්තකට, නැතිනම් පොත්කට සමාන වෙනවා. මුළු දිවා කාලය තිස්සේ කුරු බස්සා නිදා ගන්නවා.

ඇඳිරි වැටුන විගස කුරු බස්සා අවදි වෙනවා. වටපිට බලා මඳ වේලාවක් සවන් දී ඉඳලා කුරුමිණියන් සහ සමනලයින් අල්ලා ගෙන කෑමට ඉගිලී යනවා.

සතුන් අල්ලා ගැනීමේ දඩයම අතරතුරදී කුරු බස්සා අත්තක වහලා සින්දු කියනවා. දිවා කාලයේදී ගී ගයන කුරුල්ලන්ගේ සින්දු වගේ නො වේ ය. කුරු බස්සා ගේ සින්දුව ඒකතානමය "ටියූ! ටියූ! ටියූ!" හඬකි. නමුත් කෙනෙක් එය ඇසීමට ආශා කරයි. කැලෑවේ මහා කලුවරේ ඉන්නා විට, කුරු බස්සා ගේ ගීතය ගුප්තමය ගතියක් ඇති කරයි.



# බසු පැටවා

බසු පැටවා සෙවනේ ගස් කොටයක් උඩ රෑ වනතුරු ඉවසීමෙන් ඉන්නවා, බසු අම්මා එයාට කෑම ගෙනැවිත් දෙන තෙක්. එයා දැන් ලොකු පැටවෙක්, නමුත් තවමත් එයා දඩයම් කිරීමට දන්නේ නැහැ.

වැඩක් නැතිව මුළු දවස තිස්සේ ඉඳීමත් පාළු ගෙනදෙයි. බසු පැටවා වටපිට බැලීමට පටන් ගත්තේ කාන්සිය නිසා. බසු පැටවා මගේ ඇසට හමුවුනා. අපි දෙදෙනාම සතුටු වුනා. බසු පැටවාට එය විනෝදයකි. මට සතුට ගෙන දෙන මුන ගැසීමකි. පැටියා මෝඩ බව මම එයාගේ ඇස්වලින් දැනගත්තා. ඒ වගේම එය ලොකු ආත්ම විශ්වාසයක් ඇති කර ගත්ත පැටවෙක්. මම එයාට පාඩමක් උගැන්වීමට සිතලා බසු පැටවා ළඟ උක්කුටිකයෙන් වාඩි වුනා. හිස වනලා අත් දෙක වැනුවා. දෑත් දෙපැත්තට වීසි කළා. විනෝදවීම ලොකු සතුටකි. මම බසු පැටවා මූණ ළඟට වම් අත දිගුකරලා අත කරකවලා එයා ගේ අවධානය යොමු කළා. දකුණු අත පැටවා ගේ පසු පසට පරිස්සමෙන් යැව්වා. හිටි හැටියේ එයාගෙ බෙල්ල අල්ලා ගත්තා!

එයාව රැවටූ බව බසු පැටවා දැනගත්තේ එවිට යි. එයාට කේන්ති ගිහිල්ලා, ඔරොවලා හොටෙන් කොටන්න යි, නියපොතුවලින් සූරන්න යි පටන් ගත්තා. එයා මා කෙරෙහි බොහොම කෝප වුනා. මා වැරදිකරුවෙක් නොවෙයි. බසු පැටවා ඕනෑවට වඩා ආත්ම විශ්වාසයෙන් හිටියා. එය තම යි වරද!



# ලම්බක කුරුල්ලා



නොයෙක් කුරුල්ලො විවිධ වර්ග වලට අයත් කුරුලු කූඩු සහ කැදලි සාදති. චිප් කුරුල්ලාගේ කූඩුව පුංචි මඩුවක් වගේ ය. ටුර්ඩස් කුරුල්ලාගේ කැදැල්ල කෝප්පයට සමාන ය. කහ කුරුල්ලා ගේ කූඩුව තොටිල්ලක් යැයි කිව හැකි ය. කඳුකර කුරුල්ලාගේ කැදැල්ල මැටි ඇතිලියකට සමානය. ලම්බක කුරුල්ලා සාදන කැදැල්ල ගෙතූ අත්මේස් කවරයකට සමානය! එය පුළුල් මෙන් සිනිඳුය.

ගසක ඉතාම සිහින් අත්තේ ලම්බක කුරුල්ලා මේ අත් මේස් කූඩුව ගොතා සවි කරයි. කුණාටු නිසා මේ කූඩුව පීඩා විඳින නමුදු සතුරාට එයට ළඟා විය නොහැකි ය. මේ කූඩුවේ ඇඟිල්ලක් වැනි දිගැති තැන කුඩා විවරයකි. ලම්බකයා කූඩුවට ඇතුළු වන්නේ මේ විවරයෙනි.

මේ කූඩුව අත්තේ එල්ලී තිබෙන අතර එය ශක්තිමත් ය. මෘදු ය, උණුසුම් ය. විවරය වටා සුදුවන් පටියක් වැනි ගෙත්තමකි. අඳුරේ වුව ද ලම්බක කුරුලු අම්මාට ඇතුළුවීමට මින් පහසුය.

මේ වර්ගයේ කුරුළු අම්මලා සහ තාත්තලා පැටවුන්ට බොහෝ ආදරය කරති, සැලකිලි දක්වති. පැටවුන්ට අම්මා තුඩෙන් කෑම ගෙනැවිත් විවරයට ඉස්සෙල්ලා ම හිස දමා ඇතුළු වෙයි. විවරය වටා ඇති සුදුවන් පටිය කුරුල්ලාට ඉලක්කය වේ. ලම්බක කුරුල්ලා මේ විවරය කිසිදිනක වරද්දා නොගනී.



# නිල් කුරුල්ලා



ඈත සිට බලන විට මේ නිල් කුරුල්ලා පෙනෙන්නේ කළු පාටිනි. ළඟ සිට බලන විට සහ හිරු රැස් වැටුණු විට පමණක් මේ කුරුල්ලා නිල් පාටින් පෙනේ. එවිට එයාගේ ලස්සන නිසා දෙනෙත් ඉවතට ගැනීමට සිතක් ඇති නොවේ. හඬ නගමින් ගලා බසින පෙණ නංවන ජලය සහිත ගංගාවක මැද පිහිටි ලොකු ගල් කැටයක් මත නිල් කුරුල්ලා සිටී. එයාගේ නිල්වන් පිහාටු මත වැටෙන කුඩා ජල බින්දු මුතු ඇට මෙන් පෙනෙයි. නිල් කුරුල්ලා බෙල්ල පහත් කොටැ වලිගය උස්සා නටවන විට එය දිලිසෙන නිල් පාටින් බබලයි!

ජලය හඬ නගමින්, පෙණ නංවමින් ගලා බසී. නිල් කුරුල්ලා කෑ ගසන විට එයා ගේ නාදය දසත පැතිර යන්නේ ජලයේ හඬ විනිවිද ගෙන ය.

නිල් කුරුල්ලා ජලයට ආශා කරයි. ජලය අසල ගයන මේ සතා ජලයේ පාවෙන මාලු පැටවුන් සහ බිත්තර ආදිය කෑමට ගනී. කුරුළු කූඩුව හදන්නේ ත් ගංගා, ඇල, දොල, වැව්, පොකුණු අසල ය. දිය ඇල්ලකට පිටුපසින් වුවද කූඩුව සාදා ගනී! කෑම රැගෙන කුරුළු අම්මා දිය ඇල්ල විදගෙන එන විට නො ඉවසිලිවත් පැටවු උන් ගේ කහපාට කටවල් ඇරලා 'ජය හඬ' නගති.



# කළු ටුර්ඩස් කුරුල්ලා

අපි දන්නා ටුර්ඩස් වර්ගයට අයත් කුරුල්ලන් නම් කරමු: ගී ගයන ටුර්ඩස්, මීදුමාකාර ටුර්ඩස්, තිත් සහිත, සුදු ඇහි බැම් සහිත, සුදු උදර සහිත කළු ගෙළ සහිත, සුදු ගෙළ සහිත කුඹුරු ටුර්ඩස් කුරුල්ලෝ සිටිති. මේ පක්ෂීන් අතුරෙන් ඉතාම හොඳ ගායකයා කහ පාට හොටක් සහිත කළු ටුර්ඩස් කුරුල්ලාය.

හිරු කන්දට එහා සෙමින් බැස යයි. නිහඬතාවය පැතිර යයි. මාකඳුරු අන්ධකාරයෙන් වැසී යන අතර එය පල්ලම් දක්වා පැතිරේ. වාතය පවිත්‍ර වේ, ඉතා පැහැදිලි වේ. එය කොතරම් පැහැදිලි වන්නේ ද යත්, ඈත තිබෙන කුඩා කන්දේ මුදුන පවා පෙනේ. මෙම නිහඬතාවයෙහි සහ විනිවිද පෙනෙන වාතයෙහි කළු ටුර්ඩස් කුරුල්ලා ගයයි.

මේ පක්ෂියා ගේ ගීතය ඉවසිලි සහගතය, යම්තමින් දොම්නස් සහිත ය. හඬ නගා දෝංකාරය ඇතිවන තෙක් බලා සිටී. යළිත් හඬ නගන කුරුල්ලා තවත් කළු කුරුල්ලෙකු හඬ නගන තෙක් බලා සිටී. කඳු එකිනෙකාට කසු-කුසු ගාන්නේ කළු කුරුල්ලා ගේ දොම්නස් හඬිනි. අඳුර දසත පැතිර යන තුරු මෙලෙස හඬ නගන කුරුල්ලෝ ඉන් පසුව ද තරමක් වේලා යන තෙක් එලෙස ගීතමය හඬ නගති.



එම විල කොතරම් විශාල ද යත්,
එය ක්ෂිතිජය දක්වා ද,
ඊට ත් එහා අහස දක්වා ද
පැතිර ගිය සැටියෙකි.



# නිල්වන් විල

ස්ටෙප්ස් භූමියේ ඈත කෙළවරේ ඇති කුඩා තිත යූර්ට කුඩාරමකි. එම කුඩාරමට එහා දළ බෑවුමකි. ඊට එහා ජලය පිරි විශාල විලකි. එම විල කොතරම් විශාලද යත්, එය ක්ෂිතිජය දක්වා ද, ඊට ත් එහා අහස දක්වාද පැතිර ගිය සැටියෙකි.

මේ විලෙහි ජලය නිල්වන් පැහැයෙන් දිලිසෙයි. රළ පහර විල් තෙරට විත් සුදු පෙණ නංවමින් වැදෙයි. ඒ සුදුවන් පෙණ වලට ඉහළින් පියාඹන චයිකා පක්ෂීන් පෙනෙන්නේ සුදු පැහැති පුළුන් රොදවල් ලෙසිනි. රතුවන් තුඩුවේ රතු පාටට හුරු රළු සේරාවෝ පඳුරුවලට වී නිදති. විල් තෙර සහ ජලය අතර කළුවන් ගල් කැට අසල ඇති පෙණවලැ කළු සුදු පැහැති පෙගාන්කා තාරාවෝ දිය නාති. උන්ගේ රතු පිරිගල් වලට සමාන හොටවල් හිරු රැස් නිසා දිලිසෙන්නේ, ඒවා මත ජල බිංදු ඇති බැවිනි.

විල් ජලය නිහඬය. රාජාලියෙක් හිරු අසලින් අහසේ ඉතා ඉහළ පියාඹයි.

ජලය දෙසද, අහස දෙස ද, විල්තෙර දෙසද බලමින් පැය ගණනක් වුවද කිසිවක් නො සිතා ඇවිද්ද හැකිය. නමුත් පසුව ඔබ ඇවිද්දේ නිකමට නොවන බව ඔබට දැනෙයි. මෙයින් හදවතට ලොකු සතුටකි, එමෙන්ම මොළය නො නවත්වා වැඩ කරයි.

නිල් ජලය පිරි විල අති විශාලය. සුළං හමයි. ජලය හඬ නගයි. විල් තෙර පස් තෙතමනය සහිත ය. සියුම් සිදුරු සහිත ය. ඈත ජලය නිල්වන් කඳක් සේ අහසට නගින විටෙක මෙනි.







# පෙලිකන් වරු

ගොඩ බිම පෙලිකන් පක්ෂියෝ අදක්ෂ සහ නුහුරු අය වෙති. උන්ගේ පාද බකල ය. හොට විශාල ය. අශෝභන ය.

එහෙත් ජලයෙහි පෙලිකන් වරුන් සුරඟනා කතාවල එන නැව්වලට සමාන වේ.

මේ පක්ෂීන් නිල්වන් ජලය මැඩ ඉදිරියට ඇදෙන්නේ සුදු පැහැති පපුව ඉදිරියට නෙරා ගෙන ය. පෙලිකන් වරුන් පීනන්නේ සෙමිනි. උන් පියාපත් ඉහලට ඇද ගන්නේ සමහරවිට දියට තෙමීමට බිය වන්නාක් මෙනි. හිටි හැටියේ විශාල හොට දියට ඔබා මාළු අල්ලයි.

එක් පෙලිකන් පක්ෂියෙක් පෙතියෙක් හොටින් අල්ලා ගෙන, ඒ මාළුවා උඩ විසි කොට කට හැර ඌ ගිල දමයි. නැවත පෙලිකන් පීනන්නේ සුදු පැහැති නැවක් මෙනි. එයා ගේ හොට පපුව මත තිබේ.

පෙලිකන් වරුන් ජලයෙන් අහසට නගින්නේ බරැති ලෙසිනි, පාද වල ඇති කොරපොතු වලින් හඬක් නිකුත් කරමිනි. එහෙත් ඉහළට පියාසර කිරීමට පටන් ගත් පසුව උන් ලෙහෙසියෙන් උණුසුම් වාතයෙහි පියාසර කරන්නේ කවාකාර ලෙසිනි. ඉන්පසුව පෙලිකන් පක්ෂියෝ විවේක ගැනීමට ගොඩ බසින අතර තරමක් වේලා නිදි කිරති, පිහාටු අව්වේ වේලා ගනිති.

පියපත් විදහා ගෙන හොට ගොජුර දෙසට නවා ගනී. හුළං හමන විට ගොජුර බැලුමක් සේ පිම්බෙයි. ඉගිලෙන විට උගේ ගොජුර වෙලා ගෙන, යළිත් වරක් මාළු බෑමට සූදානම් වෙයි.



පෙලිකනයෝ යහපත් පක්ෂි වර්ගයක් වෙති. උන් සමූහ වශයෙන් කූඩු සාදා ගනිති. එය දියෙහි පාවෙන කුඩා අතු සහ රිකිලිවලින් සාදා ගන්නා අතර එය පහුරකට සමාන වේ.

උන්ගේ හඬ ඈත සිට වුවද ඇසිය හැකිය. පෙලිකන් වරුන්ගේ කැදැලි හෙවත් පහුරු වලට මග වැරදී තිබෙන සැටියෙකි. පෙලිකන් පැටවු බඩගිනි වූ විට මහා ඝෝෂාවක් ඇති කරති. කැබලිවලට පොඩි කරන ලද මාළු පෙලිකන් අම්මලා පැටවුනට කැවීම සිරිතකි. පෙලිකන් කූඩු වෙතට යාම පිට අයට ඉතා අසීරු වන්නේ එය වටා මූකලානක් වැනි ඝනව වැඩි ඇති පැළෑටි ආදිය නිසාය. මඩ ගොහොරු සහ අති විශාල වශයෙන් මදුරුවන් නිසා ද ඒ පෙලිකන් පහුරු ආරක්ෂා වී තිබේ.





# මහොන් සමනලයා

ඉතාම ලස්සන සමනලයකු බව ඔබටම පේනවා, නෙව! මලක වහලා ඉන්නා විටද, බිම සිටින විට සහ ඉගිලෙන විට ද, මේ සමනලයා ලස්සන ය. අවාසනාවකට මෙන්, සමනලයන් එකතු කරන්නන් විසින් මේ සමනලයා ගේ සිරුර අල්පෙනෙත්තකින් පෙට්ටියකට සවිකර තිබෙන විට ද, එයා ලස්සනය. නොයෙකුත් සැරසිලි සඳහා ද, මොසයික් චිත්‍ර පවා සඳහා ද මේ සමනල පිහාටු පාවිච්චි කරනු ලැබේ. මෙවන් එක් චිත්‍රයකට පිහාටු දහස් ගණනක් අවශ්‍ය වේ. ඒවාට තෝරා ගන්නේ ඉතා ලස්සන සහ ඉතා පැහැදිලි ඒවාය. මහොන් සමනලයාගේ පියාපත් ද විශාල වශයෙන් මේ සඳහා පාවිච්චියට ගනිති.

මොසයික් චිත්‍රවල පිහාටු දුර්වර්ණ වී ඒවා දුවිලි වලින් පිරෙයි. එහෙත් ඒවා ප්‍රණීත හා අලුත් ව තිබෙන විට ද, මල්වල වසා සිටින සමනලයන් තරම් ඒ චිත්‍ර ලස්සන නැත. එක් මලක වසා සිටින එක් සමනලයකු වුව ඒ චිත්‍ර වලට වඩා සුන්දරය.



## රැන වටුවා



රැන වටුවා ජලයට ද, ගොහොරු බිම් වලට ද, තෙතමනය සහිත දෙණි බිම් වලටද, නදී සහ විල් තෙරවලට ද කැමතිය. කැස්පියන් රැන වටුවා කිසියම් හේතුවක් නිසා වියළි ස්ටෙප්ස් බිමට කැමති ය. මේ කුරුල්ලා වියලි ස්ටෙප්ස් බිමේ ඉතාම වියලි තැන වාසය කරයි. මේ ප්‍රදේශ වියළි සුළං වලින් පීඩා ලබයි.

මේ රැන වටුවා නග්න බිමෙහි බිත්තර දමයි. මේ බිත්තර අඩක් දූවිලිවල ගිලිලාය. කුරුලු අම්මා බිත්තර රකින වාද, නැතිනම් දූවිලිවල තාපය නිසා ඒවා රැකෙනවා ද යන්න තෝරා බේරා ගැනීම ලෙහෙසි නැත. සමහර විට මේ බිත්තර රකින්නේ දූලි විසින් ද ?

රැන වටු බිත්තර දැකීම කොහෙත්ම බැරි තරම් ය. පැටවු දැකීම ඊටත් වඩා අසීරු දෙයකි. පොළොව පළාගෙන ගියාක් මෙන් මේ පැටවු විසිර යති. මෙම ස්ථානය එහෙම පිටින්ම විවෘත වූ අතර කුඩුව වටා අතු, රිකිලි හෝ පඳුරු හෝ නොමැත. ඇස් විදහා ගෙන බැලුවද පැටවුන් නොපෙනේ. ඔවුන් මේ අහල පහළ සිටිය යුතු වුව ද ඔබගේ ඇසට හසු නොවේ!



# දිය මානෙල්



දිය මානෙල් පොකුරක් කඩා ගෙනැවිත් මල් බඳුනකට දැමිය හැකි ය. එහෙත් පැයක් තුළ දී ඒවා මැල වී යයි. දිය මානෙල් මාලයක් ගොතන්නට පිළිවන. එනමුදු ඒවා වඩා ත් කලින් මැල වෙයි. දිය මානෙල් තියෙන තැන තිබෙන්නට ඉඩ දුන්නොත් මුළු ගිම්හානය පුරා ඒවා මිනිසාගේ ඇස පිනවයි!

මුළු දවස පුරා හිරුරැස් නාන මානෙල් මල් හවස් වන විට හැකිලෙයි. සුදුවන් මල් පෙති වැසී යන්නේ අතක ඇඟිලි නවන්නාක් මෙනි. එවිට මල් පෙති හැකිලීම නිසා මල මැද ඇති රන්වන් පුරුෂ කේශර නොපෙනී යයි. මෙසේ එකට ගොනු වූ දිය මානෙල් මල ජලය යටට බසී. උදය වනතුරු දිය මානෙල් දිය යටට වී නිදයි. හිරු නැගෙත්ම ඉහළ ඇදෙන මේ කුසුම හිරු රැස් වලට සිය පෙති විදහා ගෙන සිටී. එවිට රන් පැහැති පුරුෂ කේශරය සහ සුදු පැහැති මල් පෙති දිලිසේ. එහි මැද කොටස කෝප්පයකට සමාන ය. ඒ කෝප්පය තුළ මල් ඇට ය.

මල් ඇට මෝරන තෙක් අපට දිය මානෙල් බලා සතුටු විය හැකි ය. අපට වේලාව පවා දිය මානෙල් අනුව බලා ගත හැක්කේ හැමදා ම එය එකම වෙලාවට පිපෙන බැවිනි. ඒ අනුව කාලගුණය බැලීමට හැකි වන්නේ, එය වැසි දවසට නොපිපෙන බැවිනි.



# රෝස පැහැති ස්ටාර්ලින්ග්

රෝසවත් ස්ටාර්ලින්ග් පක්ෂීහු ද සිටිති. මේ කුරුල්ලා ගේ හිස සහ පියාපත් කළු ය.

කළුවත් මෙන්ම රෝසවත් ස්ටාර්ලින්ග් පක්ෂියෝ ද සමාගම් ප්‍රිය කරති. තනිවම ජීවත් නොවන මේ කුරුල්ලෝ විශාල රංචු වශයෙන් එක් වී, කඳු වල පැලුම් තුළ සහ විශාල ගල් ගොඩවල් මත වාසය කරති. අති විශාල රංචු සහ රැන් වශයෙන් ජීවත්වන ස්ටාර්ලින්ග් පක්ෂීහු කීචි-බීචි ගාති, ගී ගයති, ශබ්ද කරති, පොර කා ගනිති. පැය ගණනක් තිස්සේ වුවද මේ කුරුල්ලන් දෙස බලා සෑම විනාඩියක් පාසා ම සතුටු විය හැකි ය!

මේ කුරුල්ලන් නිතර පාහේ තණ පෙත්තකු, නැතිනම් පතංගයකු හොටින් ගෙන සිටින සැටි පෙනේ. සමහරු කුඩා කුරුමිණි සතුන් කීපදෙනකු රොත්ත පිටින් හොටින් ගෙන සිටිති. උන් ඉතා කැමති ආහාරය පතංගයා ය. ස්ටාර්ලින්ග් කුරුල්ලෝ මේ පතංගයින් අල්ලා ගැනීම සඳහා ස්ටෙප්ස් භූමියේ ඉතා ඈතට පියාඹති. ස්ටාර්ලින්ග් පක්ෂීන් ඉතා විශාල වශයෙන් පතංගයින් කා දමන නිසා මිදි වතු හා පලතුරු පැළ විනාශ කිරීම ද ගොවියෝ ඉවසති. ගොවීන්ගේ එම ක්‍රියාව නිවැරදිවය. මේ තරම් ලස්සන සහ මිතුරු කුරුල්ලන් චෙරි ගෙඩි කිහිපයක් හෝ මිදි පොකුරක් කෝ නොවටී ද? සියලු ගොවීතැන් විනාශ කරන පතංගයින් කා දමන ස්ටාර්ලින්ග් කුරුල්ලන්ගෙන් සිදු වන්නේ මහඟු සේවයකි.



# රතු සේරාවෝ

රතු සේරාවෝ ඉතා අපූරු පක්ෂීන් ය. ඒ ගොල්ලන් ගේ පාට දිහා බලන්න. එය තද රතු පැහැයකි. බැලූ බැල්මට එකවර උන්ව පෙනේ. උන්ගේ කෑ ගැසීම තාරාවන්ගේ හඬට වඩා පාත්තයින් ගේ හඬට සමාන ය. උන් ගොඩැලි වල, නැතිනම් පඳුරක් යට කූඩු නො සාදන අතර කුඩා ගුහාවල, බිල තුළ කූඩු සාදා ගන්නවා. සාමාන්‍ය තාරාවා මෙන් මඩ ගොහොරු බිම්වල කූඩු සාදා ගන්නේ නැත. නග්න ස්ටෙප්ස් භූමිවල ද, කඳු මුදුන්වල ද රතු සේරාවෝ මෙලෙස කූඩු සාදා ගන්නවා! මාමට් ලේන වඳුරන් සහ හිවලුන් අතහැර ගිය ගුහා මේ සේරාවෝ සිය වාසයට ගන්නවා. සමහරවිට ගල්ගුහා මිනී වලක් පවා මේ සේරාවන්ගේ වාසයට සුදුසු වේ. කඳුවල පැලුම් සහ බිලවල බිත්තර දැමීම සඳහා කැදලි හදනවා.



රතු සේරා පැටවුන්ට මේ නිසා බොහෝ අමාරුකම් වලට මූණ පෑමට සිදු වෙනවා. මේ පැටවු තමන්ගේ දුබල පියාපත් විදහා ගෙන කන්දේ සිට බිමට පනින්න ඕන. නැතිනම්, අන්ධකාරය පටු වළක සිට එළියට එන්න දඟලන්න ඕන. ඉන් පසුව මේ ගොල්ල සේර අම්මා ගේ පසුපසින් ගිහිල්ලා වතුර ඇති තැනට ළං වෙන්නට ඕන.

ඔවුන් ගේ හැසිරීම පුදුමාකාර වුවත් උන් තාරා වර්ගයට අයිති යි. අනිත් ජලජ පක්ෂීන් මෙන්ම රතු සේරාවන්ට ද හඬ නැඟීමට හොටවල් ද, පීනීම සඳහා බැඳි පටල සහිත පාද ද ඇත. කොහොම වුනත් සේරාවන්ට ජලය නැතිව ජීවත්විය නොහැකිය.



## ගැරඬියා

ගැරඬියා විෂකුරු සර්පයකු නොවේ. එසේ වුවද ඌ සර්ප පවුලට අයත් එකෙකි. ඌ හමු වුනොත් කෙනෙකුට බොහෝ කල් යනතුරු ඌ අමතක නොවේ. පඳුරුවල ද, නොයෙක් ගල් කැට අස්සේ ද, කඳුවල ද ඌ හමුවේ. ගැරඬියා එහි යන්නේ හිරු රැස් නෑමට සහ සතුන් අල්ලා ගැනීමට ය. ගැරඬියා කුරුල්ලන්, කුඩා සතුන්, කටුස්සන් සහ තණ පෙත්තන් අල්ලා කයි. හොරෙන් බඩ ගා ගොස් ගොදුරට පැන එය දත් වලින් අල්ලා ගනී. ගැරඬියාට අසු වූ සතා දැඟලීමට පටන් ගත්තොත් ඌ සතා වටේ එතී ඌව මරා දමනු ඇත.

හැම කෙනෙක් ම කුරුල්ලන්ට කැමති අතර ගැරඬියාට කැමති අය ඉන්නේ ටික දෙනෙකි. එහෙත් මේ ගැරඬියා දෙස විමැසිල්ලෙන් බලන්නේ නම්, ඌ ලස්සන පාටවලින් යුත් සර්පයකු බව ඔබට පෙනෙනු ඇත. නපුරු නැති ඌ කදිම සතෙකි. කුරුල්ලන් මෙන් ම මිනිසුන්ගේ ගෙවල් අසල වාසය කිරීමට කැමති ගැරඬියා ගෙට යටින් සාදා තිබෙන බිම් ගෙයි සිටින මීයන් අල්ලාගෙන කයි. අට්ටාලයේ වාසය කරන වී කුරුල්ලන් ද ගැරඬියාට ගොදුරු වේ. ගැරඬියා මෙය කොතරම් ඉක්මණට සංවර ලෙස හැංගිහොරා කරන්නේ ද යත්, ගෙදර මිනිස්සු මොනවා වෙති දැයි නොදනිති. ඔවුන් ඒ ගැන නොදැන සිටීම හොඳ දෙයකි. එයින් මිනිසුන්ට කරදරයක් නො වන අතර ගැරඬියාට ද නිවී හැනේ සිටිය හැකිය. ලංකාවේ බොහෝ දෙනක් ගැරඬියා නීච සතකු ලෙස ගණන් ගනිති.

ඈත සිට බලන විට
සියලු කඳු නිල් පැහැතිය.
පෙළකට පසුපසින් තවත් පෙළකි.
ඈත යත්ම,
වඩාත් නිල් පැහැයෙන් බබළයි.



# තද නිල්වන් කඳු

ඈත සිට බලන විට සියලු කඳු නිල් පැහැතිය. පෙළකට පසුපසින් තවත් පෙළකි. ඈත යත් ම, වඩාත් නිල් පැහැයෙන් බබලයි.

ඔබ ගමන් කරත් ම, කඳු වඩාත් ළං නො වෙයි. ඒ අතරම ඒවා වඩාත් උසට පෙනෙයි. දැන් ඔබ විඩාපත් වී සිටියද කඳු වඩාත් ඈතට පෙනෙයි.

ඔබ දැන් කඳු පාමුලට පැමිණ සිටී. දැන් කඳු පෙළ ඔබට ඉහළින් ඇති අහස සිටී.මේ වන විට කඳු සියල්ල නිල් පැහැයෙන් නොව විවිධ පාටවලින් පෙනේ. කොළ පැහැති, දුඹුරු පැහැති සහ රතුවට හුරු කඳු දැන් ඔබගේ දෙනෙක් ඉදිරිපිට ය. එකම පාටකින් යුත්, හැඩයකින් සහ උසකින් හෙබි කඳු නැත.

හැම කන්දකට ම ස්වීයත්වයක් ඇත. එය ලෝකයේ විවිධ දේ මෙන් විවිධ ය. කඳු පාමුල සිට මුදුන දක්වා යන විට, දැනෙන්නේ නිවර්තනයේ සිට උත්තර ධ්‍රැවය දක්වා යන්නාක් මෙනි. කන්දක් නගින විට කාන්තාර සහ ස්ටෙප්ස් බිම් ද, දෙණි බිම් සහ කේතුධර වනාන්තර ද, තුන්ද්‍රා සහ කිසි කලක දිය නොවන හිම හා අයිස් ද දැකීමට පිළිවන.

ඔබ මෙවැනි කඳු මුදුනෙක සිටින විට, වළාකුළු සහ කුරුල්ලො ඔබට පහලින් පියාඹති. දිය ඇලි සහ ගංගා ඔබගේ හිසට උඩින් ඇත. ආරුක්කුවට යටින් යන්නාක් මෙන් දේ දුන්නට යටින් යා හැකිය. ඔබට පාවෙන වලා අතරින් ගොස් තරුවක් ඇල්ලීමට ළංවිය හැකි යි. අවුරුද්දේ සියලු කාලගුණයන් ඔබ ඉදිරියේය.

පෘථිවියේ සියලු සුන්දරත්වය ඔබ අත්ලෙහි ඇතිවාක් මෙනි. යළිත් කඳු පෙළවල් ය. ඈත සිට බලන විට යළි කඳු ය. පෙළින් පෙළ උසින් උස කඳු පිහිටා ඇත. ඒවා සියල්ල නිල් පැහැයෙන් නැහැවිලා ය. ඉමක් නැති ගිරි, කඳු පෙළවල් ය.







# සයිබීරියානු පහන් මල්



හරිත වර්ණ තණ බිමෙහි රතු-කහ පැහැති මේ කුඩා මල බබලයි. රුසියන් බසින් එය 'ෂර්කි' යැයි කියනු ලැබේ. ඒවා කුඩා පහන් මෙන් දිලිසේ.

යම් කිසි දෙයක් වැඩි වූ විට ඒවාට සිත් ඇදගැනීමේ ඇති ශක්තිය අඩු වේ. එහෙත් මල් වල කාන්තිය කිසිදිනක අඩු නොවේ. රතුවන් පොපි මල් ද, කහවන් මල් ද, නිල්වන් මල් ද, හිම මෙන් සුදු පැහැති ඩේසි මල් ද මෙහි ඇත. රතු-කහවන් පහන් මල්පිටිය පුරා වැවිලා ය. ඔබට ඒ අසල නැවතී මල් දෙස බැලීමට ආශාවක් ඇති වේ. ඒ දර්ශනය කෙතරම් රමණීය ද යත්, එයින් නෙත් ඉවත ගැනීමට ඔබට නොහැකිය.

සීත සමයේ දී ද, මුළු මහත් සයිබීරියාව සනැති හිම තට්ටුවකින් වැසී සිටින විටද ඔබට මේ පහන් මල් මතක් වෙයි. අලුත් තණ බිමෙහි රතු-කහවන් මේ පහන් මල් දැකීමට ඊළඟ ගිම්හානය වන තෙක් ඔබට ඉවසා සිටිය නොහැකි තරම්ය.



## කඳුකර එළුවෝ



කඳු බෑවුම්වල නිහඬතාවය පැතිරෙන්නේ විරල අවස්ථාවල දී ය. මෙම බෑවුම්වල නිතර කුඩා ගල් කැට පහළට පෙරළේ. මෙලෙස පහළ වැටෙන ගල් කැට රහස් හුවමාරු කර ගන්නා බව කඳුකර වැසියෝ කියති. මේ ගල් කැට වලට කීමට රහස් ද, ඉදිරිපත් කිරීමට දුක් ගැනවිලි ද ඇත. පහළට ගලා බසින ජලය මේ ගල් කැට සෝදා හරියි, සුළඟට හසුවී පහළට පෙරළේ. අව්වට ගිනි රත් වන මේවා හවස තද ශීතට හසු වේ.

නමුත් කඳුකර එළුවන් කඳු නගින විට හඬ නගමින් ගල් කැට බිම පෙරළේ. අරුණෝදයේ දී මෙලෙස බිමට රූරා වැටෙන ගල් කැටවලින් සංගීතයක් වැනි යමක් නිකුත් වෙයි. කඳුකර එළුවෝ උන් ගේ පැටවු සමඟ කඳු නගින අතර පැටවු උඩ පනිමින් සෙල්ලම් කරමින් යති.

මේ එළුවෝ හීලෑ සතුන් නො වෙති. කඳුකර හීලෑ නොවූ එළුවෝ පහළට වැටෙන ගල් කැටවල ගීතමය හඬ අසමින් කඳු නගති.





## චිප්මන්කුවා

බලන්නකෝ වැඩක හැටි! වල් ඌරා චිප්මන්කුවා (ලේන වර්ගයකි) ගේ කෑම ටික හොරාගත්තා, නෙව! යෝධ වල් ඌරා පුංචි චිප්මන්කුවා ගේ ගබඩාවට වැදිලා එයාගේ සියලු කෑම හොරකම් කළා. වල් ඌරා උගේ දළවලින් බිම හාරනවා. ඉව අල්ලා පුංචි චිප්මන්කුවා ගේ ගබඩාව විනාශ කළා. නොයෙකුත් ඇට වර්ග, මද වර්ග සහ කුඩා ගෙඩිවර්ග, සූරියමල් ඇට, තිරිඟු ඇට චිප්මන්කුවා එකතු කරගෙන ගබඩා කළා.

හිම වැටෙන ඉතා තද ශීත කාලෙට ඉස්සෙල්ලා ඇතිවන සිසිර කාලයේදී චිප්මන්කුවා මේ කෑම වර්ග සොයාගෙන බිම ගෙයක තැන්පත් කරනවා. ශීත කාලයේදී මේ ඇට වර්ග ඉදිලා කෑමට බොහොම හොඳ තත්වයක පවතිනවා. මේ කෑම වල තෙතමනය, පෙඳපාසි ඇතිවීම, වේලි යාම වැළැක්වීමට චිප්මන්කු පුංචා බොහොම මහන්සි වෙනවා. ශීත කාලයේ දී එම හිම නිද්‍රාවට වැටෙනවා. ඒ කියන්නේ මාස දෙක තුනක් එක හුස්මට නිදා ගැනීමයි. වසන්තය ඇති වනවාත් සමග කෑමට ගැනීම පිණිස තම යි, චිප්මන්කු පුංචා මේ තරම් මහන්සි වෙලා කෑම එකතු කරන්නේ. ඉතින් අර වල් ඌරා නිසා කෑම සියල්ල නැති වුනා.

අනුන්ගේ කෑම කාලා වල් ඌරා බඩ පුරවාගෙන සතුටින් ගෙදර ගියා. අපේ චිප්මන්කු පුංචා එයා එකතු කෑම ටික උදුරා ගත් නිසා දුකින් වාවා ගන්න බැරිව ගීතයක් සිවුරු හඬ ලමින් ඉන්නවා.



# තිත් මුවා

තිත් මුවා ගේ ලස්සන නිසා එයාව 'මල් මුවා' යන නමින් හඳුන්වනවා. මේ ලස්සන නිසා එම මුවන් එහෙමපිටින්ම වඳ වීමට තරම් ළං උනා. හැම දඩයක්කරුවෙක් ම මේ සතුන් මරා දැමීමට ඉදිරිපත් වුනා. දැන් තිත් මුවා ගේ ලස්සන නිසාම එයාව ආරක්ෂා කිරීමට ඉදිරිපත් වී සිටී. සෝවියට් සංගමය පුරා ඇති වනාන්තරවල තිත් මුවන් පදිංචි කරවීමට සෝවියට් ආණ්ඩුව ඉදිරිපත් වුනා.

මේ ලස්සන සතා දුටු විගස සිතට ලොකු සතුටක් ඇතිවෙනවා. අතු කොළ සහ පඳුරු අස්සේ සිට ඉදිරියට එන තිත් මුවා ඉතා ඉක්මනින් අතුරුදහන් වෙනවා. මලක් වගේ ලස්සන මුව පැටවා දුටුවොත් ඔබට ඒ පැටවාව හැමදාම මතක සිටිනු ඇත. කොළ යම්තමින් හඬ නගයි. මුව පැටවා දෙපා ඈත තබාගෙන ඉන්නා විට හිරු ගේ ලප පැටවා ගේ පිට උඩ සෙල්ලම් කරනවා වගෙයි. කළු පැහැති, ලොකු ඇස්, තෙතමනය සහිත පුළුල් නාසය, විලුද වැනි සිනිඳු ලොකු දෙකන් ඇති මේ පුංචි මුව පැටවා තණ පිටියේ තියෙන ලස්සන, අපූරු මලක වගේ ය. තිත් මුවා, මල් මුවා ය.





# චෙචෙවිට්සා කුරුල්ලා



සෝවියට් සංගමයේ සමහර කුරුල්ලන්ට නම් තබා ඇත්තේ උන් නගන හඬ අනුවය. කෙක්ලික් නමැති කඳුකර කුරුල්ලා "කෙක්-ලික්, කෙක්-ලික්!" යන හඬ නගයි. උදොද් කුරුල්ලා "උදොද්-උදොද්!" හඬ නගයි. කුකුෂ්කා හෙවත් කොහා "කු-කු!" හඬ නගයි. රතු පාට හිසක් ඇති පිරිමි චෙචෙවිට්සා කුරුල්ලා "චෙචෙ-විට්සා"යන හඬ නගන බව රුසියන්නු කියති.

මේ කුරුල්ලා හඬ නගන්නේ ප්‍රශ්නයක් අසන ලීලාවෙනි: "චෙචෙ-විට්සා?" එයාගේ නම චෙචෙවිට්සා ද, නැති ද යන්න එයාට ස්ථිර නැතිවාක් මෙනි.

කොහොම වුණත් එයාගේ නම චෙචෙවිට්සා ය. රුසියන් බසින් චෙචෙවිට්සා යනු මෑ ඇටය ය. මේ කුරුල්ලා ගයන ගීත ද නොයෙක් දෙනාට නොයෙක් ලෙසින් ඇසේ. මේ කුරුල්ලා රුසියාවට එන්නේ මාස දෙකකට පමණි. අනෙක් පක්ෂීන්ට වඩා පසුවී රුසියාවට එන මේ කුරුල්ලා අනිත් අයට වඩා වේලාසනින් රුසියාවේ සිට උණුසුම් පළාත්වලට පියසර කරයි. පැටවුන් රුසියාවේ වනාන්තරවල ඇති කරන චෙචෙවිට්සා යළි උණුසුම් රටවල් බලා පියාඹයි...



# අළු කුකුළා

අළු කුකුළා වන වාසී පක්ෂියෙකි. මේ පක්ෂියා බිය සහිත ය. සුපරීක්ෂාකාරී ය, අවිශ්වාසයෙන් හැසිරෙන්නෙකි. මේ අළු කුකුළා ළඟ සිට බැලීමට සමත් වූයේ ඉතා ටික දෙනෙකි. සාමාන්‍යයෙන් මේ පක්ෂියා දැකීම ලෙහෙසි නැත. නමුත් අළු කිකිළිය බිත්තර රකින විට ඔබ එයා අසලටම ගියද, එයා එකද පිහාටුවක් කෝ නො සොල්වා සිටි තැනම සිටී. ඇසි පිය පවා නොහෙලා සිටින්නේ ගල් ගැසුනාක් මෙනි. එයා ගේ අළු පාට නිසා එයා පිට අයට නොපෙනෙති යි ද, එම පාට එයාගෙ ආරක්ෂාවට යැයි ද අළු කුකුළා සිතන්නාක් මෙනි. සමහරුන්ට ළඟට විත් අතගෑමට වුවද අළු කුකුළා ඉඩදෙයි. නමුත් එය නොකළ යුතු දෙයකි. මේ පක්ෂියා කුකුළකු වුවද හීලෑ සතකු නොව වනවාසී සතෙකි. සමහරවිට අළු කුකුළා කොතරම් බය වනවා ද යත්, බිත්තර රැකීම පවා අතහැර දමා පලා යනු ඇත. බොහොම අපූරු අළු කුකුළු පැටවුන් දොළොස් දෙනකු එයින් වනයට නැති වීමට ඉඩ ඇත.



# පතහ පිඹුරා

කන්දට එහා හිරු බැස ගොස් අඳුර වැටෙත්ම, මේ පිඹුරා ගොදුරු සොයා බඩගා යාමට පටන් ගනී. හිරු පායන විට පවා ගල් කැට අතර සිටින පිඹුරා වෙන්කොට හඳුනා ගැනීමට ලෙහෙසි නැත. හවස් වන විට පිඹුරා මිනිස් ඇසට කොහෙත්ම සොයාගත නො නො හැකි ය. ඉතා සුළු හෝ සුරු-සුරු ශබ්දයක් ඇති වූවොත්, ඔබ පරිස්සම් විය යුතුයි! පතහ පිඹුරා භයානක සෝෂ සර්පයාගේ ළඟ නෑයෙකි.

සෝෂ සර්පයා ගේ මෙන් මේ පිඹුරා ගේ ද නාසය සහ ඇස අතර කුඩා වලක් තිබේ. මේ වල ඝන අන්ධකාරය පවතින විටද ගොදුරු සොයා ගැනීමට පිහිට වන්නේ එයට ජීවමාන සතුන්ගේ උෂ්ණත්වය දැනෙන බැවිනි. සෝෂ සර්පයා මෙන්ම පතහ පිඹුරා ද වලිගය උඩට හරවා නටවන්නේ එහි අග ගිගිරියක් තිබෙන විටෙක මෙනි. එයින් පිටවන ගිගිරි හඬ සෝෂ සර්පයාගේ හඬට දෙවැනි නොවේ. පතහ පිඹුරා සෝෂ සර්පයා මෙන්ම විසකුරු නොවුවද, ඌ දෂ්ට කළොත්, එය ඉතා භයානකය.

පතහ පිඹුරා ප්‍රථමයෙන් පහර නොදෙයි. මිනිසාගේ පියවර හඬ ඇසුණු විගස ඌ බඩ ගා ඈත් වී යාමට තැත් කරයි. අනිකුත් විස සෝර සර්පයින් මෙන් ම, මේ පිඹුරා සෙමින් බඩගාන අතර එතරම් දක්ෂ නොවේ. හවස ඇඳිරිය පවතින විට කඳුකරයේ ඇවිදීමට ඔබට සිදුවුවොත්, නිතර දෙපා දෙස බලන්න.



# වලසා

වනයෙහි අනිවාර්යයෙන්ම වලසා සිටිය යුතුය. වලසා නැති වනය සැබෑ වනය නො වේ. එවැනි වනයක් සිත් ගන්නේ ද නැත.

වලසෙක් වනයේ සිට එළිමහන් තැනකට ආවා. තණ උඳුරා සැපීමට, තණ බිඩැලි උඳුරා දැමීමට, බිඳුනු අතු කඩා දැමීමට, ගල් පෙරලීමට වලස් රාල ඉදිරිපත් වුනා.

සුළං වලට බිම වැටී තිබෙන අතු වලට යටින් වලස් රාලට කුහුඹුවන් සහ කුහුඹු බිත්තර සොයාගත හැකි යි. ලොකු ගල් කැට පෙරළා දැම්මා ම එයාට ඒවා යට ඉන්න පණුවන් හා කුරුමිණි සතුන් අල්ලා කෑමට ගත හැකි යි. වලස් රාළ තණ පිටියේ තියෙන ගුල් හාරන්නේ දිග නියපොතු සහිත යෝධ අත් වලින්. ඒ විදියට එයා කැලෑ මීයන් වාසය කරන මී ගුල් හොයා ගන්නවා. තණකොළ එයාට සුදුසු කෑමක් නො වේ. ඒ නිසා තණකොළ විකලා කෙළ ගහනවා.

වලස් රාළගේ එකම වැඩේ කෑම සෙවීම යි. එයා මහ ගොඩක් කෑම කන නිසා තමයි එයාගේ සිරුර ඒ තරම් මහත් වෙලා තියෙන්නෙ. ඉර අව්වට වලසා ගේ ලොම් දිලිසෙනවා. ගොඩක් කෑම කන නිසා එයා ශක්තිමත්. වලසා කැලෑවේ කිසිම සතෙකුට බය නැත. මෙය ඇතුන් සහ සිංහයින් නැති රුසියාවේ කැලෑ වලට බලපානවා. වලසා බය මිනිස් ගඳට විතරයි. ඒ නිසා තමයි වලසා නිතර ඉව අල්ලන්නේ. මිනිස් ගඳ දැනුණු විගස වලසා වහාම පැනලා යනවා.



බොහෝ  කලකට පෙර මහා මහ පොළොව පැලිලා
ගැඹුරු පැල්මක් ඇති වුනා.
මෙය කැනියම නමින් හැඳින්වේ.
ඒ කැනියමට එබී බැලුවොත් හිතට බියක් ඇති වී,
හිස කරකැවෙන සැටියක් දැනේ.

බොහෝ කලකට පෙර මහ පොළොව පැලිලා ගැඹුරු පැල්මක් ඇති වුනා. මෙය කැනියම නමින් හැඳින්වේ. ඒ කැනියමට එබී බැලුවොත් හිතට බියක් ඇති වී, හිස කැරකැවෙන සැටියක් දැනේ. ඉස්සර කාලේ මේ පැල්ම දිගේ ගඟක් ගලා බැස්සා විය යුතු යි. දැන් මෙම වියලි ගං පතුල අතහැර දැමූ මගකට සමානය. එහි පතුලේ කුඩා ගල් කැට සහ පස් දක්නට ඇත.

මේ වගේ තැනක ගමන් කරන විට ඔබ පැරණි නගරයක නටබුන් ඔස්සේ යන බව ද, මේ කඳු වැටි පැරණි මන්දිරවල සහ දේවාලවල නටබුන් බව ද සිතාගන්න.

මෙහි බලකොටු ය. ඒවා කුළුණු සහ බැලුම් කණු සහිත ය. මේ ආගාධ හරහා ඉස්සර පාලම් සහ ආරුක්කු තිබුණාක් වැන්න.

මෙහි කුපෝල සහිත දේවස්ථාන සහ මුස්ලිම් පල්ලි ය. ඉස්සර තිබුණු නිවාස පංතිවල නටබුන්ය. බිඳුනු දොර සහ ජනේල ය. කැඩී බිඳී ගිය පඩිපෙළවල් ය. දැන් ඔබට මිනිස් කටහඬ ඇසෙන්නාක් මෙනි. ගැල් රෝද හඬ, අසුන්ගේ කුර හඬ, සන් කටු ගැටෙන හඬ, අසිපත් ලෙලදෙන හඬ ඇසෙන්නාක් බඳු ය. කිසිවක් ඇති වෙතැ යි යන බියෙන් ඔබ බලා සිටී...

එහෙත් එවන් කිසිවක් නැත. නිහඬතාවය සහ උෂ්ණය පවතී. පටු, තද බෑවුම් සහිත නිම්නයෙකි, කැනියම. මේ කැනියමේ ගැඹුරු පැල්මට හිරු එළිය වැටුණු විට එය දම් පැහැයෙන් පෙනෙයි. ඒ නිසා එයට දම්පැහැති කැනියම යැයි නම් කරමු.

# දම් පැහැති කැනියම









# කෙක්ලික්

මේ පක්ෂියා එනමින් රුසියානුවන් හඳුන්වන්නේ එයා "කෙක්-ලික්, "කෙක්-ලික්!" වැනි හඬක් නංවන නිසා ය. එමෙන්ම කඳු වල වසන බැවින් එයා කඳුකර කුකුළා යන නමින් ද හැඳින් වේ.

හවස නින්දට යෑමට පෙර සහ උදේ නැගිට්ට විගස මේ කුකුළා "කෙක්-ලික්!"යන හඬින් කෑ ගසනවා. මේ කුකුළාගේ 'කෙක්-ලික්' හඬ කඳු බෑවුම් සහ ලොකු ගල් කැට වලින් නිකුත් වන නිසා ඒ පෙදෙස එකම කුකුළු කූඩුවක් වගේ ය! නමුත් කෙක්ලික් කුකුළන් පෙනෙන්නට නැත.

කෙක්ලික් ඉගිලෙන විට සහ දුවන විට පමණක් දැකිය හැකි යි. ඉගිලෙන විට මේ පක්ෂියා ඉබේටම කඳු බෑවුම දිගේ වැටෙන සැටියක් පෙනෙයි. එයා බඩ ගාන්නක් වැනිය. එහෙත් බෑවුම දිගේ ඉහළට දුවන විට එයාගෙ පාද මහත රතු පාට බෝතල් වලට සමාන ය. එයා ගේ පාද වලට හසු වන කුඩා ගල් කැට බිම පෙරළා හඬ නගයි. සැඟවී සිටින කෙක්ලික් පක්ෂියා දැකීමට නො හැකි ය. අපට පමණක් නොව, රාජාලියන්ට සහ උකුස්සන්ට පවා ඌ නොපෙනේ. කඳුවල ගල් කැට කෙක්ලික් නැතිව සුසාන බිමක් මෙනි. කෙක්ලික්ට ද මේ කඳු සහ ගල් කැට නැතිව ජීවත්වීමට නොහැකි ය.



## මාමට් ලේනා



විශාල පර්වත අතරින් ඔබට නළා හඬක් වැනි හඬක් සහ තියුණු කැගැසීමක් ඇසෙති නම්, එහි තේරුම මාමට් ලේනා ගුහාවේ සිට ඉර අව්ව තපින්න ට එළිමහනට ආ බව ය. හරියට අහුරන ලැබූ පිදුරු අව්වට වේලෙන්නට තැබුවාක් මෙනි. මාමට් ලේන්නු වාඩි වී, හිස හරවමින් වට පිට බලති.

වාඩි වී, වටපිට බලා, සුළං පහරට ඉව අල්ලා මෙම ලේන්නු බඩ පැත්ත ගල් උඩ තබා වැතිර ගත් විට ලොමින් කළ බුමු තුරුණු වේලෙන්නට දැම්මාක් මෙනි. මේ 'බුමුතුරුණු' ඈනුම් හරිති. දෙනෙත් තද කොට වසා ගනිති. නිදි කිරා වැටෙති.

කටු තණ පඳුරු වලට ඉහළින් සමනලයෝ පියාඹති. කඳුකර කුරුල්ලෝ කඳුවල හඬ නගති. කඳුකර කුකුළා ගල් කැට අස්සට වී හඬලයි. ෂිපොව්නික් පඳුරු සුළඟට සෙලවෙන විට, ඒවායේ කහවන් මල්වල පෙති හැලෙයි. එහෙත් මාමට් ලේනාට කිසිදු ගානක් නැත. පොඩ්ඩක්වත් සෙලවෙන්නේ නැතුව මාමට් ලේන්නු සැපට නිදති.





# මල් සහ සමනලයෝ

මල් කොතැන ද එතැන සමනලයෝ ය. සමනලයින් කොතන ද එතැන මල් ය. මල් සහ සමනලයින් එකිනෙකට අඛණ්ඩ ලෙස වෙලී පවතී. මල් නැතිව සමනලයින්ට ජීවත්ව නො හැකි ය. සමනලයින් නැතිව මල් ද නො පවතී. සමනලයෝ මල් පරාගණයට හසු කරති. එවිට මල් සමනලයින්ට මිහිරි මල් පැණි ලබා දෙති. සමනලයින් පියාඹන මල් ලෙස හඳුන්වති නම්, මල් නිදන සමනලයින් ලෙස හැඳින්විය හැකිය.

වියළි අගල් වල එතරම් ගොඩක් මල් නැත. ඒ නිසා හැම මලක් ම ඇසට හසු වේ. හැම මලක්ම ඉතා පුදුමාකාර ය. එක මලක් කොතරම් තියුණු කටු තිබේ ද යත්, එය ඇල්ලීම පවා නො නො හැකි ය. තවත් මලක් කොතරම් තද පාටින් බැබළේ ද යත් කෙනෙකුට දෙනෙත් තදින් වසා ගැනීමට සිදුවේ! තෙවන මල පාට රහිතය. ඒ නිසා කෙනෙකුගේ නෙතට එය හසු නොවේ. ඊළඟට පොපි මලකි. එහි රතුපාට වෙනුවට රන්වන් පාටකි. පෙති රහිත ඩේසි මලකි. එය කහවන් බොත්තමකට සමානය. දම් පැහැති කුඩා කිරීට සහිත මල් 'සදා කුසුම' ලෙස හැඳින්වේ.

හැම මලකට ම විශේෂ වූ සුවඳකි. සමහර මල් මිහිරි පැණි රසකින් යුක්තය. සමහර මල් ඉතා තිත්ත ය. නැතිනම් විනාකිරි මෙන් කට දයි. තවත් මල් මිරිස් වැනි ය. මේ සුවඳ ආඝ්‍රාණය කරන සමනලයෝ, බඹරු සහ මී මැස්සෝ තමන් කැමති මල් තෝරා ගනිති.



කාලගුණය උණුසුම්ය. වියළිය. පිණි රහිතය. වැසි රහිත ය. තෙතමනය ආරක්ෂා වී ඇත්තේ මල් වල පමණකි. දැන් සමනලයින්ට මල් තෝරා ගැනීමට අවස්ථාවවක් නැත. දැන් සෑම මලක්ම ගණන් ගනු ලැබේ. එය කොතරම් කුඩා වුවද, සරල වුවද කමක් නැත. සදා කුසුම ඉතා කුඩාය. එහි පැණි ඇත්තේ ඉතා ස්වල්පයකි. කළු සමනලයා එය සොයා ගනී. සමහර මල්වල පැණි ඇත්තේ යන්තම් හොටය (ශුණ්ඩය) තෙමා ගැනීමට පමණකි. මෙලෙස පැණි බිංදුවෙන් බිංදුව උරාගෙන පණ රැක ගනී, සමනලයා!





# රාජාලියා

රාජාලියා කන්ද උඩ වසා සිටිනවා දැකීමට පුළුවන් වන්නේ නිතර නොවේ. මන් ද යත්, රාජාලියා විරල පක්ෂියකු බවට පැමිණ ඇති බැවිනි. රාජලියන් නැති කඳු මුදුන් ලිහිණියන් නැති මුහුදු සහ ගී ගයන කොවුලන් නැති ස්ටෙප්ස් බිමට සමාන වේ.

රාජාලියා දඩයම් කරන විට එය බැලිය යුතු දර්ශනී ජවනිකාවකි!

මේ පක්ෂියා කඳු පෙළට ඉහළින් පියාඹන විට අනිත් සියලු සත්වයෝ පහළ සැඟ වෙති.

රාජාලියා පහලට පියාඹත් ම අනිත් සත්තු බියෙන් නෙත් වසා ගනිති.

රාජාලියා පියාපත් විදහාගෙන ශක්තිමත් හොට සහිත හිස ඒ අත මේ අත හරවයි. කුණාටුව හඬ නගමින් මේ පක්ෂියාගේ පිහාටු සිප ගනී.



# රාජාලි පැටව්



කැදැල්ලේ රාජාලි පැටව් තිදෙනෙකි. බාලයා, මද්දුමයා සහ වැඩිමලා ය. පැටව් තිදෙනාගේ වයස එකිනෙකාට වෙනස් ය. රාජාලි අම්මා එක් බිත්තරයක් දමා බොහෝ වේලාවකට පසු තවත් බිත්තරයක් දමයි. එහෙත් පළමුවන බිත්තරය දැමූ විගස එය රැකීමට පටන් ගනියි.

මුල් දවස් වල දී රාජාලි පැටව්, රාජාලියන්ට වඩා කුකුළු පැටවුනට සමානය. පුළුල් වැනි පිහාටුවලින් උන්ගේ සිරුර පිරිලා ය. පුළුන් වෙනුවට පිහාටු ලබාගෙන දුඹුරු පැහැයට හැරී දෙපාවලින් නැගී සිටින විට මේ පැටවු නියම ලෙසින්ම ගොදුරු ගසා කන පක්ෂීන් බවට පත් වෙති. මෙලෙස තවත් මාස එක හමාරක පමණ කලක් තිස්සේ මේ රාජලි පැටවු කූඩුවේ සිටගෙන සිටිති.

රාජාලි අම්මා සහ තාත්තා පැටවුන්ට රසැති කෑම ගෙනෙන තෙක් බලා සිටීම නිසා පැටවුන්ගේ ඉවසීම සිඳී යයි. තමන් අනාගතයේ දී ජීවත් වීමට බලාපොරොත්තු වන කඳු දෙස මේ පැටවු බලන්නට පටන් ගනිති. පියාපත් දෙපස ඇති පිහාටු පුංචි රාජාලියෝ සුද්ද පවිත්‍ර ලෙස විසීමට ඉගෙන ගනිති. පියාපත් වනා උඩ පනිමින් ශාරීරික අභ්‍යාසයෙහි යෙදීම පටන් ගන්නේ මේ කාලයේ දී ය. අනාගතයේ දී එය ප්‍රයෝජනවත් වෙයි. නියමිත කාලය පැමිණි පසු ය, රාජාලි පැටවුන් කූඩුව අතහැර පියඹා යන්නේ, එදාට මේ නවක රාජාලියෝ පියාපත් විදහා අහසට පියඹා තමන්ට වාසය කිරීමට නියමිත මේ ලෝකයේ විශාලත්වය දකිති.



# රාජාලි බස්සා

රාත්‍රී කාලයේදී තමන්ගේ ගුහා වල ඉඳගෙන එකිනෙකා අමතමින් රාජාලි-බස්සෝ හඬ නගති. මේ සතුන්ට එම ගුහා කොහෙත්ම නරක ස්ථානයක් නොවේ. එහි හාවුන්,කෙක්ලික් කුරුල්ලන්, පරවියන් සහ ස්ටාර්ලින්ග් පක්ෂීන් රාත්‍රිය ගත කරන නිසාය.

දිවා කාලයේදී මම මේ පල් හොරුන්ගේ ගුහාව සොයා ගතිමි. එය කඳු බෑවුමක පිහිටියේය. නැග එන හිරු රැස් ගුහාවේ පැලුම් අතරින් රතුවන් ගල් කැටයක් මත වැටිණි. සිංහාසනයෙක මෙන් එය මත වාඩි වී සිටින රාජාලි-බස්සා නිදි කිරා වැටෙයි. බසු රාල තිගැස්සී මා දෙස බලා, දෙනෙත් මහත් කොට ඔරවා, ගොරවා, හොට ගටා හඬක් මතු කොට වියරු බළලකු සේ ගුහාවෙන් පිට වී පියෑඹී ය.



බසු රාළගේ 'සිංහාසනය' අසල උෟ නො කෑ ආහාර තිබිණි. මේ නපුරා ඊයේ මරාගත් සතා මොකා දැ යි මම දැන් නිට්ටාවට ම දනිමි. මම බසු රාළට බැණ වැදුණේ තේරුම් රහිතව ය. ඉතිරි වූ කෑමවල කුරුල්ලන්ගේ, රෑන වටුවන්ගේ නැතිනම් ස්ටාර්ලින්ග් කුරුල්ලන් ගේ පිහාටු එකක්වත් නො තිබිණි. කුඹුරු මීයන්ට, ගෝපරයන්ට සහ වැලි මීයන්ට අයත් මස්, ලොම් සහ කටු දක්නට තිබිණි. මේ සතුන් හානි ගෙනදේ.

රාජාලි බස්සා එතරම් නරක සතෙක් නොවන බව මින් පෙනේ. එසේ වුවද, මේ පක්ෂියාගේ බාහිර පෙනුම භයංකර ය. බසු රාළ විශේෂයෙන් මහ රෑ බියජනක ලෙස හූ හඬ නගයි, කෑ ගසයි.



# ටොලායි හාවා

පඳුරක් යට සිසිල් සෙවනෙහි ටොලායි හාවා නිදයි. එයා ගේ දිගැති කන් පිට උඩට වැටිලා ය. මයිල් සහිත නිකට ඉස්සරහ ගාත් දෙක උඩ තබාගෙන ඇත. දෙනෙත් වැසී අතර තරමක් නැමී ඇති ඇස් පිහාටු දිගුය.

මට දැන් මේ ටොලායි හා පැංචාව පයකින් ස්පර්ශ කළ හැකි ය. මා එන බවක් නො දත් හා පැංචා සැපට නිදයි. මම තව දුරට ත් කුමක් කරම් දැ යි නොදැන එතැන සිටියෙමි. හාවගේ රැවුළු ගස් සෙළවිණි. නැහැය විසුළු ලෙස නැටවිණි. ඇස් පිහාටු එසැවිණි. හා පැංචා ගේ දෙනෙත් දොට්ට පැනීමට තරම් මහත් විය.

හා පැංචාගේ ලස්සන දුඹුරුවන් දෙනෙත් වල ඉමහත් බියක් උපණි. මරණ බිය කොතරම් ද යත්, ඇස් දෙක බස්සකු ගේ තරම් විශාල විය.

මම හුස්ම නොගෙන ඇසිපිය නො හෙළා සිටිමි. හා පැංචා නිසා මට ඉමහත් බියක් උපණි. මේ අතර එයා හිටි හැටියේ සන්සුන් විය. බිම දිගා වී යළිත් නිදන්නට පටන් ගත්තේ ය. මා නොසෙල්වී සිටි තැනම සිටි නිසා මා කපා දැමූ ගස් කොටයක් ලෙස හා පැංචා සිතා ගත්තා විය යුතුය. ගස් කොට නිසා හාවෝ පවා බිය නො වෙති.

පියවරෙන් පියවර මම මේ ටොලායි හාවා ගෙන් ඈත් වීමි. එයා නින්දෙන් අවදි වුණාම මවිත වෙනවා ඇති. නේද! මෙතැන තිබුණු ගස් කොටයකට මක් වුණා ද? තමාට එය පෙනුණා කියා හා පැංචා සිතනු ඇති.



පාලු ගෙන දෙන අළුවන් ස්ටෙප්ස් බිමෙහි
හිටි හැටියේම ඔබගේ නෙත්වලට
උසැති කඳු ගැට පෙළක් හමු වේ,
එපමනක් නොව,
එය දීප්තිමත් රතු පැහැයෙන් බැබලේ!

# රතුවන් කඳුගැට

පාළු ගෙන දෙන අළුවන් ස්ටෙප්ස් බිමෙහි හිටි හැටියෙම ඔබගේ නෙත් වලට උසැති කඳු ගැට පෙළක් හමුවේ. එපමණක් නොව, එය දීප්තිමත් රතු පැහැයෙන් බැබලේ!

ප්‍රථමයෙන් එය මිරිඟුවක් යැයි කෙනෙකුට සිතේ. එහෙත් ස්ටෙප්ස් බිමෙහි මිරිඟුව ක්ෂිතිජයෙහි පෙනෙන දුමාරයක් වැනි දෙයකි. එය නදියක්, නැතිනම් විලක් ලෙස පෙනේ. මෙම නොසන්සුන් ජලකඳෙ හි දුපත් පාවෙන සැටියෙකි.

එසේ වුවද, මේ කඳු ගැට චලනය නොවේ. ඒවා ඉතා යසට පෙනේ. රතුවන් මේ කඳු ගැට නොසැලී සිටින අතර පැහැදිලිය. කඳු ගැට පෙළට ළංවත්ම, ඒවායෙහි ඇලි ජලය නිසා හෝදා පාලු වෙලා තිබෙන සැටි පෙනේ. එහි වංගු සහ කෝණාකාර උල් ද, මුදුන් ද සුළං නිසා සිනිඳු වී ඇත.

මේ කඳු ගැට පෙළ අතර ඇති වංගු සහිත රළු බිත්ති වැනි ඉඩ අතරින් යාමට ඔබට සිතෙයි. කඳු ගැට වල ඉදිරියට නෙරාගිය කොටස් හා වංගු අතරින් එබී බැලීමට සිතකි. රළු බිත්ති අතරින් ගමන් කරන විට ඔබේ දෙනෙත්වල පෙනීම සහ කන්වල ශ්‍රවණය තීව්‍ර ව පවතී. විශාල ඇස් ඇති රාජාලි-බස්සෙක් අන්ධකාර ගුහාවෙන් එළියට විත් මුදු පියාපත් විදහා වංගුවෙන් හැරී පියාඹයි. රතුවන් සේරවෝ කඳුකර කර්නීසයේ සිට පියාපත් ගටා හඬ නංවමින් පියාඹති. කාන්තාරයේ කඳුකර ස්නෙගිරි කුරුල්ලො පැලුම් සහිත හිඩැසිවල සිට බළල් පැටවුන් සේ 'මුරු-මුරු' ගාති.

වනයේ වනමල් ය, වන පැළෑටි ය. වල්පැළෑටි වගයක් බාඕබාබ් ගස්වලට බෙහෙවින් සමාන ය. පුදුමාකාර කහ පැහැති පොපිමල් දිලිසේ. වන ලතා නැමී, හැකිලී සිටින වැටි හූරන් සිහියට නඟයි. අප නොදන්නා මල් වර්ගයක් සිනිඳු රතු පැහැයෙන් දිලිසේ. ඒවා අත ගෑවොත්, ලේ ගැලීමට තරම් සම තුවාල වෙයි. හැමතැනම රතුවන් පස මත හිම වැනි සුදුවන් ලුණු පොත්තකි.

රතු කඳු ගැට වලින් පිරුණු, අපූරු පක්ෂීන් සහ පැළෑටි සහිත චමත්කාරජනක ලෝකයෙකි!







# වෛරම් උරගයා

වෛරම් උරගයා ඌට නියමිත ලෙස දිගැති වයිරම් සහිත සමකින් සැරසී සිටී. මේ උරගයා ගැන තවත් කිව හැක්කේ මොනවාද? මේ වෛරමා සිහින් ය, කඩිසර ය, දක්ෂ ය, පස් සහිත සහ මැටි සහිත පෙදෙස් වල වාසය කරන වෛරම් උරගයා තමාගේ සහ අනුන් ගේ ගුහාවලට වැද රෑය කරයි. දිවා කාලයේදී කුරුමිණියන්, තණ පෙත්තන්, මකුළුවන් සහ කුහුඹුවන් දඩයම් කරයි. උරගයා මේ සතුන් දඩයම් කරන්නේ පොළවේ හා තණ බිමේ ය. සමහර විට තරමක් උසැති පඳුරුවලට පවා බඩගා ගොස් මේ කුඩා සතුන් අල්ලා ගනී. දඩයමින් පසු වයිරම් උරගයා අව්ව තපියි. රාත්‍රී කාලයේ දී වැලි අස්සට රිංගා ගනී. නැතිනම් ගුහාවකට ඇතුළුවෙයි.

වයිරම් උරගයා බිත්තර දමන්නේ පස් යට ය. ගිම්හාන කාලයේ දී බිත්තර බිඳ ගෙන සෙන්ටිමීටරයක් තරම් දිගැති පැටව් බිහි වෙති. පැටවුන් ගේ සම ද වයිරම් සහිත ය.

මේ සතා ගැන කිව හැක්කේ මෙපමණ යි. ඔබට මෙය නො සෑහේ නම් උරගයින් නිරීක්ෂණය කිරීම පටන් ගන්න.



# ස්කරාබ් කුරුමිණියා

ලෝකයේ ඉතාම ප්‍රසිද්ධ කුරුමිණියා ස්කරාබ් යන නමින් හැඳින් වේ. පුරාණ මිසර දේශ දේශවාසීහු මේ කුරුමිණියා හිරු මතුපිට ලැග්ග බව විශ්වාස කළහ. එහෙත් දැන් මේ සතා නිකම් ගොම කුරුමිණියකු බව හැම දෙනෙක් ම දනිති. ඌ ගොම ගුලි කොට ඒවා බිම දිගේ ගෙන යාමට සමත් නිසා ය. කුරුමිණියා මෙලෙස ගොම ගුලි කොටැ ගෙන යන්නේ ඔළුව බිමට හරවා ගෙනැ ය!

මේ ගොම ගුලි කුරුමිණියාගේ ආහාර සඳහාය. ඌ ඒවා තැන්පත් කොට ඒවා මනා ලෙස ආරක්ෂා කරයි. වෙනත් කුරුමිණියෙක් උගේ මෙම ගොම ගුලිය උදුරා ගැනීමට තැත් කරන විට දෙදෙනා අතර අරගලයක් පැන නගී. ගොම ගුලිය ගෙන ගොස් පොළොවේ හාරා, පසු ව සන්සුන්ව ආහාර ලෙස ගැනීම සඳහා ගෙනයන අරගලයකි.



ඒ සියල්ල පසුවටය. පළමුව ගොම ගොඩින් ගුලියක් සාදා ගත යුතුය. කුරුමිණියා ගොම ටිකක් කඩාගෙන එය මත වාඩිවී එය ගුලි කරන්න පටන් ගනියි. මෙය ඇප්‍රිකට් ගෙඩියක් තරම් විශාල වූ විට, කුරුමිණියා ඔලුවෙන් හිටගෙන පාදවලින් එය ගුලි කරයි. මෙය ඉතා අසීරු වැඩකි. කිසියම් පැල්මෙක මේ ගොම ගුලිය හිර වුනොත්, එය ඇද ගත යුතු ය. නැතිනම් සමහර විට එය පල්ලමක් දිගේ රූට්ටා ගිය විට, යළි ඉහළට ගෙන යාමට කුරුමිණියා මහන්සි විය යුතු ය. ප්‍රති මල්ලව කුරුමිණියා අනිකාට එය සටනකින් තොරව ගෙන යාමට ඉඩ නො දෙයි.



# ඇපල්ලෝ සමනලයා

සමනලයා ගේ සතුරා වන මිනිසා උන් අල්ලාගෙන උන් ගේ සිරුරට අල්පෙනිති ගසා ඒවා පෙට්ටිවල දමයි. අන් සමනලයින්ට වඩා මිනිසා දඩයම් කරන්නේ ඇපොල්ලෝ සමනලයින් ය. එයට හේතුව මේ සමනලයාගේ පිහාටු ඉතා ලස්සන අතර ඒවා විවිධ පාටින් තිබීමය. විවිධ පාට සහ හැඩවලට අයත් ඇපොල්ලෝ සමනලයින් හැකි තරම් විශාල සංඛ්‍යාවක් එකතු කිරීමට සමනල ලෝලයෝ උත්සාහ ගනිති.

මිනිසාගේ අල්පෙනෙතිවලට හසුවන සමනලයින්ගේ සංඛ්‍යාව වැඩි වත් ම මල් මත වසන සමනලයින් ගේ සංඛ්‍යාව අඩු වේ. බොහෝ රටවල ලස්සන සමනලයින් විරල වී ඇති අතර රජය උන් ආරක්ෂා කිරීමට නීති සාදා ඇත. සෝවියට් සංගමයේ මෙවැනි සමනලයින් ලේඛන ගත කර තිබේ. මේ අතර ප්‍රධාන ස්ථානය හිමි වී ඇත්තේ හිම වැනි සුදුවන් පියාපත් සහිත රතු පුල්ලි ඇති ඇපොල්ලෝ නැමැති ලස්සන සමනලයාට ය.



# ගල් කැට පොල්කිච්චා



මේ පොල්කිච්චාට ගල් කැටයා යයි කියන්නේ එයා ගල් කැට අස්සට වී සිටින නිසාය. ගල්කැටයා ගේ හිසේ පසුපස කොටස සුදු ලපයකින් වැසී ඇත. ගල් කැට පොල්කිච්චා ගල් කැට අතරට වී මුළු ජීවිතය ම ගත කරයි. ගලක් උඩ වසා මේ පොල්කිච්චා තමාගේ පිහාටු සුද්ද කර ගනී. ලොකු ගලකට මුවා වී කුරුමිණියන්, තණ පෙත්තන්, සමනලයින් අල්ලාගනී. ලොකු ගලක් යට වළක් වැනි තැනෙක ඌ කූඩුව සාදාගනී.

කුරුළු පැටව් එම කූඩුවේ ඉන්නවාට වඩා ගල්කැටයක් උඩට නැග ගැනීමට කැමැති වෙති. එතැන සිට අව්ව තපිමින්, පිහාටු පීරා ගෙන, අවට බලන්නේ කෑමට යමක් සොයා ගැනීමට ය.

යම්තමින් හෝ අනතුරක් ඇති වූවොත්, වහා ම කූඩුවට රිංගා ගැනීමට මේ කුරුළු පැටවුන් සමත් ය. කුරුළු අම්මා තරමක් ඇතින් ගල් කැටයක් උඩ සිට ගෙන පොඩි එවුන්ට හඬ නගමින් අනතුරු අඟවයි. කුරුළු අම්මා කලබල වෙලා ද, එතරම් නො වෙයි. අනතුරක සේයාවක් ඇති වූ විට ඇගේ පැටව් ගල් කැට යට ඇති කූඩුවට රිංගා ගෙන ආරක්ෂාව ලබනු ඇත. ඇගේ පැටවුන් සතුරාට නො පෙනේ. සතුරාට උන් අල්ලා ගත නොහැකි ය





# ලිහිණි උකුස්සා

වෘකයා ට කෑම ලබා ගත හැක්කේ උගේ සතර පාදයේ වේගය අනුවය. ලිහිණි-උකුස්සාට කෑම ගත හැක්කේ දෙනෙත්වල තීව්‍රතාවය අනුවය. ලිහිණි-උකුස්සාට හැම දෙයක්ම පෙනෙයි. ලොකු සහ කුඩා හැම සතකුම උකුසු ඇස්වලට හසු වේ. සයිගාක් මුව රංචු ද නිදා සිටින සයිගාක් මුව පැටවකු ද, වෘක කණ්ඩායමක් ද, උන් කා ඉතිරි කළ සතුන්ගේ කොටස් ද, විශාල ඔටුවන්ගේ තවලමක් ද, යම්තමින් පෙනෙන ගොම කුරුමිණියන් ද උකුසු ඇසට යසට පෙනෙයි. ඒ අතර ලිහිණි-උකුස්සෝ එකිනෙකා දෙස උකුසු බැලුම් හෙලති. ලිහිණි උකුස්සෙක් කන්දක් මත වසා සිටියත්, අහසේ පියාසර කළත් අනික් උකුස්සා ඌ දෙස බලාගත් වනම සිටී. අන්න අසල්වැසි උකුසු රාළ පියාපත් හකුළාගෙන කඳු පහලට පියාඹනවා. එයාට මහ පොළවේ යම් ගොදුරක් පෙනුනා වගෙ යි. අනිත් ලිහිණි-උකුස්සන් දකින්නට ඉස්සෙල්ලා මාත් ඒ දෙසට පියාඹන්නට ඕන. උකුසු රාළ එසේ සිතයි.

නමුත් අනිත් ලිහිණියන් ඒ වන විටත් පියාපත් ගටා පහළට පියාඹන්නට පටන් ගෙන ඇත. මොහොතකට පෙර අහසේ සිටියේ එක් ලිහිණි-උකුස්සෙකි. දැන් ලොකු රංචුවකි. වටේට පියාඹා, ගොදුරට පාත්වී, උහු ගොඩබසිති. එකිනෙකා තල්ලු කරමින් ඉක්මන් වෙමින් ඉදිරියට දිව යති. ගොදුරු ඩැහැ ගෙන කති. බඩ පිරුණු පසු ලිහිණි-උකුස්සා නිදන්නේ වෙහෙසට පත් කළුකුමා මෙනි. යළිත් බඩගිනි ඇති වන තෙක් ලිහිණි-උකුස්සෝ මෙලෙස බිම වැතිර නිදති.



## ප්‍රාවරණ වැලි කුකුළු පැටව්

බැලූ බැල්මට ප්‍රාවරණ වැලි කුකුළා පොළොවේ ගමන් කරනවාට වඩා බඩ ගාන සැටියක් පෙනෙයි. මේ කුරුල්ලාගේ පාද ඉතා කෙටි ය. පාදයේ ඇඟිලි මහත ය. මයිල් සහිත ය, ඒවා කුර වලට සමානය. මේ නිසා ප්‍රාවරණ වැලිකුකුළා කුර සහිත කුරුල්ලා යැයි ද නම් කරනු ලැබේ.

ප්‍රාවරණ වැලි කුකුළා ඔබ ඉදිරිපිට පියඹා නොගොස් අසලින් බඩ ගාති නම්, එහි තේරුම එයාගෙ පැටවුන් මේ ළඟ කොහේ නමුදු ඉන්නා බව යි.

ප්‍රාවරණ වැලි කුකුළු පැටව් ඉතා ලස්සනය. එවුන් කොතරම් කුඩා ද යත්, ඔබට නොපෙනෙන බැවින් ඔබගේ පයට වුව පෑගීමට පිළිවන. ඒ නිසා පිය නගන විට පරිස්සම් වන්න. වඩා ත් හොඳ සැලකිල්ලෙන් පියවර තබා ඇත්වීම යි.

ඔබ ප්‍රාවරණ වැලි කුකුළු පැටවුන් නොදිටීම ගැන දුක් නො වන්න. අපි ඔබ වෙනුවෙන් එක් පැටවකු ඡායාරූප ගත කළෙමු. හිතේ හැටියට මේ ඡායාරූපය දෙස බලන්න. ස්ටෙප්ස් භූමියකට නො ගිය කෙනෙකුට පවා මෙය ප්‍රයෝජනවත් ය. ස්ටෙප්ස් භූමියට ගිය අය ප්‍රාවරණ වලි කුකුළු අම්මා කලබල වන සැටි දැක පැටවුන් සෙවීමට ඉදිරිපත් නොවී, වහාම එතැනින් පිට වී ගිය අය සඳහා ද අපි මේ ඡායාරූපය මෙහිලා මුද්‍රණය කළෙමු.



* * *

ශ්‍රී ලංකාවට වඩා දෙසිය පනස් වාරයක් විශාල රටක් වූ සෝවියට් දේශයේ නොයෙක් පෙදෙස් වල ඉතා ලස්සන සමනලයෝ, කුරුල්ලෝ, විරල සත්තු වාසය කරති. සෝවියට් සංගමයේ දේශගුණය හා කාලගුණය අති විවිධාකාරය.

ශ්‍රී ලංකාව ඇතුළු හැම රටකම ඉතා ලස්සන කැලෑ, විල්, කඳු ආදිය තිබේ. මේ සියල්ල ලෝකවාසී ජනතාවගේ පොදු දායාදයන් ය. ඒවා දේදුන්න මෙන් බහු වර්ණවලින් දිලිසේ. ලෝකයේ තිබෙන මේ ස්වාභාවික වස්තුවල සුන්දරත්වය කිසිකලෙක අඩු නො වෙත්වා.



## පාඨකයින් වෙත

මෙම නව මුද්‍රණය පිළිබඳව ඔබගේ අදහස් හා මතු මුද්‍රණ සඳහා යම් යෝජනා ඇතොත් කඩුල්ල ප්‍රකාශන වෙත දන්වා එවන ලෙස කෘතඥතා පූර්වකව ඉල්ලා සිටිමු.

ඔබගේ සියලුම ඇමතුම් පහළ මාර්ගයන් වෙතින් යොමු කරන්න.

කඩුල්ල ප්‍රකාශන
451/4 C, නුවර පාර
කඩවත
11850

Kadulla Publishing House
451/4 C, Kandy Road,
Kadawatha.
11850
Sri Lanka

+94 77 258 3942
+94 112 926 969

sales@kadullabooks.com

www.kadullabooks.com



රතුවන්
ස්ටෙප්ස්
භූමිය

කහ-රතු
පාටැති
නටබුන්

කහ පැහැති
වැලි කතර

හරිත
වර්ණ
නිම්නය



නිල්වන්
විල

තද
නිල්වන්
කඳු

දම් පැහැති
කැතියම

රතුවන්
කඳු ගැට

නිකොලායි ඉවානවිච් ස්ලද්කොව් නොයෙක්
මාර්ග දිගේ ගමන් කෙළේ ය.
ඔහු මහ වැලි කතර ඔස්සේ සංචාරවල
යෙදී සිටින අතර ගැඹුරු වළවලට බැස
ඒවායේ පතුල පරීක්ෂණයට පත් කළේ ය.
පමීර් කඳු පෙදෙසට ගිය
ඔහුගේ අවධානයට ගල් ගුහා සහ
ග්ලැසියර් නමැති හිම සහිත බිම් ලක් විය.
සීමා රහිත ස්ටෙප්ස් භූමිවල ඇවිදිමින්,
වතුර යට වැදී ජලයේ පවතින ජීවිතය නිරීක්ෂණය
කරමින් ඔහු බොහෝ කාලය ගත කළේ ය.
ඡායා රූප ගැනීම සඳහා පාවිච්චි වන කැමර ඔහු ගේ
සංචාරවල නොවැරදෙන සගයෙකි.
මෙතෙක් නොදත් දේ සමග හැම අලුත් හමුවීමක්,
හැම නව ඇඳිනීමක් ද නිකොලායි
ඉවානවිච් සඳහා ප්‍රීතිය උපදවන උත්සවයකි.
ඒ ගැන ඔහු තම පොත් මගින් තොරතුරු සපයයි.
ඔහුගේ කතා සිත්ගන්නා ය,
උණුසුම් ගතියෙන් යුක්ත ය.
නිවැරදි ය, ප්‍රබෝධයෙන් පිරිලා ය.
සොබාදහමේ විවිධ පාටැති,
නොයෙක් කටහඬ සහිත පොහොසත් ලෝකය ගැන
ළමයින් තුළ අවබෝධයක් සහ උනන්දුවක් ඇති කිරීම,
අප ළඟින් තිබෙන ජීවිතය ගරු කිරීම
හා ආරක්ෂා කිරීම ස්ලද්කොව් ගේ අදහසයි.


**කඩුල්ල ප්‍රකාශන**

240/3, පහල බියන්විල, කඩවත

+94 112 926 969

**sales@kadullabooks.com**

www.kadullabooks.com

LKR 1000.00
$ 5.99

ISBN - 978-955-7257-20-4

9 789557 257204